## 2023-02-14 වන දින පැවති ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ
## මහා සභා රැස්වීම් වාර්තාව

**මෙදින පෙ.ව.10.00 ට පමණ මහා සභා රැස්වීම ආරම්භ වූ අතර පහත නම් සඳහන් ගරු සභික මහත්ම මහත්මීන් සහභාගී විය.**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1. | ඩබ්ලිව්.එල්.රුවන් ලියනගේ මැතිතුමා | ගරු සභාපති (වැ.බ) |
| 2. | ඩබ්ලිව්. අශෝක ගුණරත්න මැතිතුමා | සභික |
| 3. | ආර්.ධනරත්න මැතිතුමා | සභික |
| 4. | අනුර ගාමිණී හෙට්ටිආරච්චි මැතිතුමා | සභික |
| 5. | එස්.කරුණාදාස මැතිතුමා | සභික |
| 6. | ජී.එච්.සුජීව විජේසූරිය මැතිතුමා | සභික |
| 7. | ජී.කේ.හරිස්චන්ද්‍ර මැතිතුමා | සභික |
| 8. | පී.ආරියවංශ මැතිතුමා | සභික |
| 9. | කුමුදු නිල්මිණී රේණුකා මැතිනිය | සභික |
| 10. | එච්.සුමිත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | සභික |
| 11. | ජී.එම්.දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා | සභික |
| 12. | මොහොමඩ් රාෆි මැතිතුමා | සභික |
| 13. | ආර්.ජී.නන්දසේන මැතිතුමා | සභික |
| 14. | කේ.ගයානි ප්‍රියදර්ශනී කුමාරගේ මැතිණිය | සභික |
| 15. | එස්.එල්.ඩී.ශිරාන් සමරතුංග මැතිතුමා | සභික |
| 16. | සුනේත්‍රා රංජනී කරුණාරත්න මැතිනිය | සභික |
| 17. | එම්.ඒ.චානක විජේරත්න මැතිතුමා | සභික |
| 18. | රසිකා වසන්ති සිරිවර්ධන මැතිණිය | සභික |
| 19. | රසිකා අරුණකාන්ති මැතිනිය | සභික |
| 20. | සනත් ප්‍රියන්ත සිරිසේන මැතිතුමා | සභික |
| 21. | රේවතී නන්දා මැතිණිය | සභික |
| 22. | ඩබ්.වී.ඩබ්. පේමචන්ද්‍ර මැතිතුමා | සභික |
| 23. | එච්.ටී.තිලකරත්න මැතිතුමා | සභික |

නොපැමිණි,

| | | |
|---|---|---|
| 1. | එස්.එම්.සේනාධීර මැතිණිය | සභික |
| 2. | ඩබ්ලිව්. තිලක් පුෂ්ප කුමාර මැතිතුමා | සභික |
| 3. | **සුගත් හෙන්ඩ්‍රි හැන්ඩ්‍රිෂන් මැතිතුමා** | සභික |
| 4. | යූ.එල් නුවන් මහේෂ් රත්නායක මැතිතුමා | සභික |
| 5. | කේ.ජී.එන්.එන්. කස්තුරිආරච්චි මැතිණිය | සභික |
| 6. | මනෝජ් ප්‍රසාද් වෙලගෙදර මැතිතුමා | සභික |
| 7. | චමිල් නිශාන්ත දිසානායක මැතිතුමා | සභික |

**01. ටී.ආර්.සී.කේ.ගුණසේකර මයා - ලේකම්**

**සභාපතිතුමා :-**

අද දින මහා සභාව වෙනුවෙන් සැපැමිණි ඔබ සියළු දෙනාම ඉතාම ආදරයෙන් පිළිගන්නවා. මුලින්ම ඇත්තේ ආගම සිහි කිරීමයි.

**01. පසුගිය රැස්වීමේ වාර්තා සම්මත කිරීම.**

**i. 2023-01-04 දිනැති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව**

**ii. 2023-01-10 දිනැති මහ සභා රැස්වීම් වාර්තාව**

**සභික එච්.ටී.තිලකරත්න මැතිතුමා:-**

2023-01-04 **දිනැති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව** මම ස්ථිර කරනවා.

විරෝධතා තිබේනම් දැනුම් දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව,** 2023-01-04 **දිනැති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**සභික එච්.ටී.තිලකරත්න මැතිතුමා:-**

**2023-01-10 දිනැති මහ සභා රැස්වීම් වාර්තාව** මම ස්ථිර කරනවා.

විරෝධතා තිබේනම් දැනුම් දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2023-01-10 දිනැති මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**03. ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන**

**I.බස් නැවතුම්පල වෙනස් කිරීම සම්බන්ධ ලිපිය** සභාගත කරනවා.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

බස් නැවතුම්පල වෙනස් කිරීම ඉතාම හොඳ කාරණයක්. දුර ගමන් බස්රථ නවත්වනු ලබන්නේ ගානටි වෙළඳසැල ඉදිරිපිටයි. එහිදී ඔවුන් බස් රථයෙන් බැස නැවත පොළ භූමිය වෙත පා ගමනින් යා යුතුයි.විශාල දුර පරතරයක් එහි තිබෙනවා. එය මෙහිදී මම දකින අඩුපාඩුවක් .එම නිසා මම කියා සිටින්නේ පැරණි බස් නැවතුම්පල අසලම බස් නැවතුම්පලක් සාදා දුර ගමන් පැමිණෙන සෑම බස් රථයක්ම නැවැත්වීමට ක්‍රමවේදයක් සැකසිය යුතුයි.එවිට එම ස්ථානයෙන් බැස ගොස් පොළ භූමියෙන් කැමති බස් රථයකට ගොඩවිය හැකියි. එම නිසා එම කාරණය ඉටු වුවහොත් සිදුකරගෙන යන වැඩපිළිවෙල අංග සම්පූර්ණ වේ යැයි මා විශ්වාස කරනවා.එමෙන්ම මේවා මහජනතාව අතරින් පැමිණි අදහස්ය.

**සභික ශිරාන් සමරතුංග මැතිතුමා:-**

පරකඩුවෙන් ඇතුලට ගමන් කරන පාරවල්වල බස් රථ මෙහි නවත්වනවා. ඔවුන්ගේ මගීන් පොලිසිය අසලින් සහ සභාව අසලින් ලබා ගන්නවා. එහිදී පොළ භූමියේ රථ නැවතුවහොත් මගීන්ගේ යම් ප්‍රමාණයක අඩු වීමක් සිදු වෙනවා.එම නිසා හැකිනම් පොලිසියට එහාපැත්තෙන් විනාඩි 05ක් 10ක් බස් රථ නැවැත්වීමට ස්ථානයක් සාදා ගැනීමට මෙය සාර්ථක වේයැයි මම සිතනවා.ඇහැලියගොඩ සිට පැමිණෙන බස් රථ සඳහාත් ගානටි වෙළඳ සැල ඉදිරිපිට නැවැත්වීමට පොලිසිය ඉඩ ලබාදෙන්නේ නැහැ.ඒ පිළිබඳවත් අවධානය යොමුකරන මෙන් මා ඉල්ලා සිටිනවා.

**සභික පී.ආරියවංශ මැතිතුමා:-**

ඒ සම්බන්ධ ලිපියක් බස් රථ හිමියන් අද දින සියළුම මන්ත්‍රීතුමන්ලා වෙත බෙදා දුන්නා.එම ලිපියේ තිබෙන්නේ රත්නපුර දෙසට අතුරු පාරවල් වල ගමන් කරන ඉඹුල්පිටිය වැනි බස් රථ සඳහා පොලිසිය අසල ඇති මගීන් සහ අනෙක් නැවතුමේ මගීන් මොවුන්ට ලබාගැනීමට නොහැකි වී තිබෙන බවයි. අප විසින් තදබදය අඩු කිරීම සඳහායි මෙම පොළ භූමියට නැවතුම්පල ලබා ගත්තේ .නමුත් නැවතත් එහි බස් රථ නවත්වනවා නම් තදබදය අඩුවන්නේ නැහැනේ.

සභාපතිතුමා:-

බොහෝ අවස්ථාවන් වලදී අප ප්‍රාදේශිය සභාවේ සිටි ගරු සභාපතිතුමන්ලා විශාල උත්සාහයක් ගනු ලැබුවා, මෙම බස් නැවතුම්පල එක් ස්ථානයකට රැගෙන ඒම සඳහා. නමුත් ලංකාවේ කිසිඳු නගරයක බස් නැවතුම්පලවල් දෙක තුනක් නැහැ. එය අප සියලු දෙනාම අවධාරණයට ගතයුතු කාරණයක්. අවිස්සාවේල්ල නගරයේ ගත් විට බස් නැවතුම්පල තිබෙන්නේ නගරයේ මෙහා කෙලවරේ. නමුත් නගරය, බස් නැවතුම්පලේ සිට විශාල දුර ප්‍රමාණයකට විහිද යනවා. රෝහල වෙත ගමන් කරන මිනිසුන් සිටිනවා කියා, රෝහල අසල බස් නැවතුම්පලක් නැහැ.බැංකුවට යනවාය කියා බැංකුව අසල බස් නැවතුම්පලක් නැහැ. අපි ඇහැලියගොඩ බස් නැවතුම්පල නගර සංවර්ධනයත් සමඟ සැලසුම් කර තිබෙන්නේ පොළ භූමිය යාබද කොටසෙහි. මෙම නගරයේ පමණක් බස් නැවතුම්පලවල් 03 ,04ක් තිබිය යුතුයි කියා සිතනවා. එලෙස සිදුකිරීමට බැහැ.මා හට විවිධ පාර්ශව වලින් චෝදනා,ඉල්ලීම් පැමිණියා. පොළ පාර මධ්‍ය ලක්ෂයේ සිට අඩි 25ක් අපි සංවර්ධනය කළා. අඩි 50ක් තිබිය යුතුයි.නමුත් බලහත්කාරයෙන් ඉදිකිරීම් සිදු කළා. මම ඒවා ඉවත් කරන ලෙස පැවසුවා. නමුත් සමහරුන් මාහට පැවසුවා මෙලෙස මැතිවරණයක් පැවැත්වෙන වේලාවක එලෙස සිදුකරන්නේ ඇයි කියා. මම කිවුවා මට එය අදාල නැහැ. මම වැඩකරන්නේ මිනිසුන්ගේ යහපත වෙනුවෙන්.පොල භූමියෙන් බස් රථ ආරම්භ කල යුතුයි. මන්ත්‍රීතුමන්ලාට පැමිණෙන චෝදනාවක් තමා නගරයෙහි වැසිකිළියක් නැහැ කියා.අපට අයත් නැති භූමිය ඉදිකිරීමක් සිදුකල නොහැකියි.නගරයෙහි පැරණි බස් නැවතුම්පල අපට අයත් නැහැ.එහි අපට අයත් පුස්තකාල ගොඩනැගිල්ල පමණයි.මම සියලු දෙනාටම ලියුම් බෙදා බස් නැවතුම්පල එතනට ගෙන යන ලෙස පැවසුවා. එහි වැසිකිළියක් තිබෙනවා. එම වැසිකිළියෙහි අඩුපාඩු තිබේනම් මම ලේකම්තුමාට උපදෙස් ලබාදුන්නා එම අඩුපාඩු සම්පූර්ණ කරන ලෙස. එමෙන්ම ව්‍යාපාරික මහතුන් සූදානමින් සිටිනවා ,එහි පැමිණෙන මගීන් සඳහා හිඳ ගැනීමට කොන්ක්‍රීට් බංකු ,පුටු ආදිය ගෙනවිත් දීමට. මෙහි එක් පරමාර්ථයක් තමා අඩු ආදායමක් තිබෙන පොළ සංවර්ධනය කිරීම.නගර තදබදයද අවම කිරීම තවත් කරුණක්.මෙය අපට වඩා පොලිසිය මැදිහත් විය යුතු කාරණයක්. විවිධ අය විවිධ කාරණා ගෙන ඒමට පුළුවන්. එමෙන්ම අවිස්සාවේල්ල බස් නැවතුම්පළෙන් බස් රථය ගමන ආරම්භ කරන විට මිනිසුන් රෝහල දෙසට යන්නේ නැහැ. පුරුදු වූ විට මිනිසුන් පැමිණෙනවා බස් නැවතුම්පලට.මෙය එකවර සිදුකල නොහැකියි.දිගෝව,වැටුම්මල,කිරිබත්ගල,උඩ ඉඹුල්පිටිය,ඉඹුල්පිටිය වැනි ගම්මාන සඳහා ගමන් ගන්නා බස් රථ පොළ භූමියෙහි නවතා තිබෙනවා. නගරයේ ඕනෑම ස්ථානයක ඇවිද ගොස් පොළ භූමියට පැමිණ එම බස් රථ වෙත ගොඩවිය හැකියි.පොලිසිය ඉදිරිපිටට යන්නේ කුමක් සඳහාද .එහි කඩයක්වත් නැහැනේ. එම නිසා එම පැරණි බස් නැවතුම්පල මම දන්නා ආකාරයට දැරණියගල විවිධ සේවා සමූපකාරයට අයත් එකක්.එමනිසා අනුන්ගේ දේපල අපට බලහත්කාරයෙන් ලබාගත නොහැකියි. මම සූදානම්කර තිබෙනවා පුස්තකාලය තිබෙන ස්ථානයේ බස් හෝල්ට් එකක් සෑදීමට. ඒ සඳහා ස්වේච්චා සංවිධාන ඉදිරිපත් වී සිටිනවා.මාර්ග සංවර්ධන අධිකාරියත් සමඟ සාකච්ඡා කර ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතිනවා.දැනට අපේ ප්‍රාදේශිය සභාව අසල නොතෙමී සිටීමට මිනිසුන්ට ඉඩකඩ තිබෙනවා. පොලිසිය ආසන්නයේ ඉඩකඩක් තිබේද කියා සොයා බැලුවා.එසේ ඉඩකඩක් නොමැතිකම ගැටළුවක් වී තිබෙනවා.ගානටි වෙළඳසැල අසල බස් නැවතුම්පලක් සෑදීමට නොහැකියි.එය අප සැවොම පිළිගත යුතුයි.එම නිසා අවශ්‍ය පහසුකම් කඩිනමින් සිදු කිරීමට නොහැකි

වුවත්, ඒ ඒ අවස්ථාවන් පිළිබඳ සොයා බලා සිදුකිරීමට බලාපොරොත්තු වෙනවා. එම යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳ බොහොම ස්තූතියි.

**සභික ජී.කේ.හරිස්චන්ද්‍ර මැතිතුමා:-**

මහා සභාවේදී තීරණයත් ගනු ලැබුවා බස් නැවතුම්පල පොළ භූමියට රැගෙන යාම සඳහා කමිටුවක් පත්කර තීරණයක් ලබා ගැනීමට. ඒ අනුව කමිටු සාමාජිකයින් වන අප විසින් ,මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,අවිස්සාවේල්ල ඩිපෝව,ප්‍රාදේශිය සභාව,පොලිසිය සමඟ සාකච්ඡාකර බස් නැවතුම්පල පොළ භූමිය රැගෙන යාම සඳහා යම් කිසි තීන්දු තීරණ ප්‍රමාණයක් ගනු ලැබුවා.එම තීන්දු වලට අනුව මේවන විට වැඩ කටයුතු සිදුකරගෙන යමින් පවතිනවා.එදින අපි පැහැදිලිව තීරණයකට එළඹුණා දේශපාලන වාසි ,පෞද්ගලික වාසි හෝ කුමන ගැටළුවක් පැමිණියත්, ලබාගත් තීන්දුවලින් පරිබාහිරව අපි කිසිඳු කටයුත්තක් සිදු නොකරන බවට. මක් නිසාද මෙවැනි තීරණයක් ගත් විට සමහරුන් දේශපාලන වාසි වෙනුවෙන් ප්‍රාදේශිය සභාවට ,සභාපතිතුමාට සහ කමිටු සභාපතිතුමාට නොයෙක් අවලාද චෝදනා නැගුවා. පාරේ සිටීමට ඉඩ නොදී වැඩ වර්ජන කරනවා,හූ කියනවා,පොළට යාමට ඉඩ නොදී සිටිනවා. නමුත් අද අපි එක අරමුණක් ඔස්සේ යමින් යම්කිසි ජයග්‍රහණ ප්‍රමාණයක් ලබාගෙන තිබෙනවා. ඒ පිළිබඳව සභාපතිතුමාට,කමිටු සාමාජිකයන්ට,රජයේ නිලධාරීන්ට ඇතුළු සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා .අලුතින් යහපත් දෙයක් ලබාදෙන විට අපේ ජනතාව ඒ පිළිබඳව සිතනුයේ සෘණාත්මකවයි.ධනාත්මකව නොසිතීමයි ලංකාව මෙවැනි නොදියුණු තත්වයකට පත්වීමට හේතුව. නමුත් ටික කාලයකින් ප්‍රශංශා නගනවා. මේවන විට තිබෙන්නේ අවලාද නගන සමයයි. මෙහිදී අපි බස් රථ රියදුරු මහතුන්,කොන්දොස්තර මහතුන් පිළිබඳවත් සිතිය යුතුයි. ඔවුන්ටත් සවන් දිය යුතුයි. නමුත් සවන් දීම යනු අපේ අරමුණ වෙනස් කිරීම නොවෙයි.ඔවුන්ට යම් කිසි පහසුකම් ප්‍රමාණයක් ලබාදිය යුතුයි. මෙම ක්‍රියාව සිදුවන්නේ ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව මුල්කරගෙනයි. එම නිසා සමහර ස්ථාන වලදී අපි දුෂ්ඨයන් කර වීරයාගේ චරිතය රඟපෑමටත් සමහරුන් උත්සාහ කරනවා. ඒවන් දේට අප ඉඩ ලබා නොදිය යුතුයි.අපේ ධනරත්න මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව වැදගත් යෝජනාවක්. එම යෝජනාව අනුව අපට හැකියාව තියෙයි සමහර බස් හෝල්ට් ඉදිකිරීමට නොහැකි ස්ථානවල තිබෙන බස් නැවතුම නැවැත්වීමට. උදාහණයක් ලෙස අපට පොලිසියට කිව හැකියි ගානට් වෙළඳසැල අසල බස් රථ නැවැත්වීමට ඉඩ ලබා නොදෙන ලෙස. එම ස්ථානයේ බස් රථ නැවැත්වුවහොත් රථවාහන තදබදයත් වැඩි වෙනවා. එසේනම් පුස්තකාලය ඉදිරිපිට බස්නැවතුමක් සාදා එහි දුර ගමන් බස් රථ නවත්වන ලෙස පැවසිය හැකියි. පොලිසිය අසලත් බස් රථ නැවැත්වීමට ඉඩ නොදිය යුතුයි. ඉඩ තිබෙන ස්ථානවල තමා බස් හොල්ට් තිබිය යුත්තේ.ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව ඉදිරිපිට ඉඩ තිබෙනවා. එහි බස් රථ නැවැත්විය හැකියි.එම නිසා අනවශ්‍ය ස්ථානවල තිබෙන බස් හෝල්ට් පොලිසිය හා කමිටු සාමාජිකයන් සමඟ එක්ව නැවැත්විය හැකියි. එමෙන්ම ඇහැලියගොඩ පුස්තකාලය ඉදිරිපිට තිබෙන ඉඩම කාටද අයත් කියා අප දන්නේ නැහැ. මේ ඉඩම මැණික් ව්‍යාපාරිකයෙක්ට අයත් වෙලා ඔහු අපිට මුදල් දී මෙය නිදහස් කර ගැනීමට කටයුතු කරනවාය කියා චෝදනාවක් යනවා.අප එවන් චෝදනා සඳහා පිළිතුරු ලබාදිය යුතුයි.

**සභාපතිතුමා:-**

මම එයට විසඳුමක් ලෙස තාවකාලිකව "ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව ,පොදු රථ ගාල" ලෙස දැන්වීමක් සකස්කර එම ස්ථානය ලණු යොදා වෙන්කර තැබීමට කටයුතු කරනවා.

**සභික ජී.කේ.හරිස්චන්ද්‍ර මැතිතුමා:-**

එමෙන්ම පදික වෙළඳාමත් සම්පූර්ණයෙන්ම නැවැත්විය යුතුයි. පොළ බදු එකතුකරන පුද්ගලයාගේ වගකීමත් නිවැරදිව ඉටුවිය යුතුයි. මහ සභාව සහ කමිටුව විසින් ගත් තීන්දු තීරණ වලට පිටින් කිසිවෙකුටත් ක්‍රියා කිරීමට ඉඩ ලබා නොදෙන ලෙස මම කියා සිටිනවා.

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -නැත**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**

i. **2023-01-10 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීම. -ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා :-**

2023-01-10 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීමට සභාවට යෝජනා කරනවා.

**සභික රසිකා වසන්ති සිරිවර්ධන මැතිනිය :-**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබෙනම් දැනුම්දෙන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2023-01-10 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීමට ඒකමතිකව සභා සම්මත විය.**

ii. **2023-01-18 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීම. -ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා :-**

**2023-01-18** දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීමට සභාවට යෝජනා කරනවා.

**සභික රසිකා වසන්ති සිරිවර්ධන මැතිනිය:-**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2023-01-18 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීමට ඒකමතිකව සභා සම්මත විය.**

iii. **2023-01-16 දිනැති ප්‍රසම්පාදන කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීම. -ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා :-**
**2023-01-16 දිනැති ප්‍රසම්පාදන කමිටු වාර්තාව** සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම **සභාවට යෝජනා කරනවා.**

**සභික රසිකා වසන්ති සිරිවර්ධන මැතිනිය:-**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2023-01-16 දිනැති ප්‍රසම්පාදන කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීමට ඒකමතිකව සභා සම්මත විය.**

iv. **2023-02-01 දිනැති දිනැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාවේ නිර්දේශ අනුමත කිරීම. -ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා:-**
**2023-02-01 දිනැති දිනැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සභාවට යෝජනා කරනවා.**

**සභික රසිකා වසන්ති සිරිවර්ධන මැතිනිය:-**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2023-02-01 දිනැති දිනැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම ඒකමතිකව සභා සම්මත විය.**

v. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු ඇහැලියගොඩ බස් නැවතුම්පල අසල කඩකාමර 10 සඳහා සහ සතිපොල අසල V හැඩ කඩ කාමර 12 (අංක 01 සහ 02 කඩ කාමර ඉවත් කර ඇත.) සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් සිදුකල තක්සේරුව මඟින් නියම කළ පහත සඳහන් බදු කුලී මුදල 2023 මාර්තු මස සිට අය කිරීම සුදුසු බවට වන යෝජනාව **සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම- ගරු සභාපතිතුමා**

**ඇහැලියගොඩ බස් නැවතුම්පල අසල කඩකාමර 10** **පොල අසල V හැඩ කඩකාමර 12**

| කඩ කාමර අංකය | වර්තමාන බදු කුලිය | තක්සේරුවෙන් පසු අය කළ යුතු බදු කුලිය |
|---|---|---|
| 01 | 1,100.00 | 2,500.00 |
| 02 | 1,200.00 | 2,600.00 |
| 03 | 1,100.00 | 2,400.00 |
| 04 | 950.00 | 2,200.00 |
| 05 | 1,000.00 | 2,200.00 |
| 06 | 1,100.00 | 2,250.00 |
| 07 | 900.00 | 2,000.00 |
| 08 | 800.00 | 1,950.00 |
| 09 | 950.00 | 2,000.00 |
| 10 | 1,050.00 | 2,150.00 |

| කඩ කාමර අංකය | වර්තමාන බදු කුලිය | තක්සේරුවෙන් පසු අය කළ යුතු බදු කුලිය |
|---|---|---|
| 03 | 650.00 | 1,500.00 |
| 04 | 625.00 | 1,500.00 |
| 05 | 625.00 | 1,500.00 |
| 06 | 600.00 | 1,350.00 |
| 07 | 550.00 | 1,350.00 |
| 08 | 525.00 | 1,350.00 |
| 09 | 575.00 | 1,350.00 |
| 10 | 575.00 | 1,350.00 |
| 11 | 575.00 | 1,500.00 |
| 12 | 650.00 | 1,500.00 |
| 13 | 650.00 | 1,500.00 |
| 14 | 675.00 | 1,500.00 |

**සභාපතිතුමා:-**

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු ඇහැලියගොඩ බස් නැවතුම්පල අසල කඩකාමර 10 සඳහා සහ සතිපොල අසල V හැඩ කඩ කාමර 12 (අංක 01 සහ 02 කඩ කාමර ඉවත් කර ඇත.) සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් සිදුකල තක්සේරුව මඟින් නියම කළ පහත සඳහන් බදු කුලී මුදල 2023 මාර්තු මස සිට අය කිරීම සුදුසු බවට වන යෝජනාව **සභාවට යෝජනා කරනවා.**

**ඇහැලියගොඩ බස් නැවතුම්පල අසල කඩකාමර 10**

| කඩ කාමර අංකය | වර්තමාන බදු කුලිය | තක්සේරුවෙන් පසු අය කළ යුතු බදු කුලිය |
|---|---|---|
| 01 | 1,100.00 | 2,500.00 |
| 02 | 1,200.00 | 2,600.00 |
| 03 | 1,100.00 | 2,400.00 |
| 04 | 950.00 | 2,200.00 |
| 05 | 1,000.00 | 2,200.00 |
| 06 | 1,100.00 | 2,250.00 |
| 07 | 900.00 | 2,000.00 |
| 08 | 800.00 | 1,950.00 |
| 09 | 950.00 | 2,000.00 |
| 10 | 1,050.00 | 2,150.00 |

**පොල අසල V හැඩ කඩකාමර 12**

| කඩ කාමර අංකය | වර්තමාන බදු කුලිය | තක්සේරුවෙන් පසු අය කළ යුතු බදු කුලිය |
|---|---|---|
| 03 | 650.00 | 1,500.00 |
| 04 | 625.00 | 1,500.00 |
| 05 | 625.00 | 1,500.00 |
| 06 | 600.00 | 1,350.00 |
| 07 | 550.00 | 1,350.00 |
| 08 | 525.00 | 1,350.00 |
| 09 | 575.00 | 1,350.00 |
| 10 | 575.00 | 1,350.00 |
| 11 | 575.00 | 1,500.00 |
| 12 | 650.00 | 1,500.00 |
| 13 | 650.00 | 1,500.00 |
| 14 | 675.00 | 1,500.00 |

**සභික එච්.ටී.තිලකරත්න මැතිතුමා :-**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව,** ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු ඇහැලියගොඩ බස් නැවතුම්පල අසල කඩකාමර 10 සඳහා සහ සතිපොල අසල V හැඩ කඩ කාමර 12 (අංක 01 සහ 02 කඩ කාමර ඉවත් කර ඇත.) සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් සිදුකල තක්සේරුව මඟින් නියම කළ පහත සඳහන් බදු කුලී මුදල 2023 මාර්තු මස සිට අය කිරීම සුදුසු බවට වන යෝජනාව **සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම ඒකමතිකව සභා සම්මත විය.**

vi. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට අයත් ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ල පළමු මහල /ඇහැලියගොඩ සතිපොල ඉදිරිපිට ඇති (ඩීප් කෝනර් ආයතනයට යාබද ) බිම් කොටස / ප්‍රාදේශීය සභා වෙළඳ සංකීර්ණයේ ධීවර සංස්ථා මාළු අලෙවිසැල උඩ කොටස (සභාවේ සැලසුමට අනුව, ලබාගන්නා ලංසුකරු විසින් තාවකාලිකව සකස් කර ගත යුතුය.)/ ඇහැලියගොඩ සතිපොල භූමියේ වැසිකිළිය/ කොහිලදෙණිය අපද්‍රව්‍ය මධ්‍යස්ථානය (ගොඩනැගිල්ල රහිත) අක්කර 01 ක බිම් කොටස/යන දේපල

බදු දීම සඳහා ලංසුපත් විවෘත කිරීමේ කමිටු වාර්තාව සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව සඳහා **මහ සභා අනුමැතිය ලබාගැනීම - ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා:-**

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට අයත් ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ල පළමු මහල /ඇහැලියගොඩ සතිපොල ඉදිරිපිට ඇති (ඩීප් කෝනර් ආයතනයට යාබද ) බිම් කොටස / ප්‍රාදේශීය සභා වෙළඳ සංකීර්ණයේ ධීවර සංස්ථා මාළු අලෙවිසැල උඩ කොටස (සභාවේ සැලසුමට අනුව, ලබාගන්නා ලංසුකරු විසින් තාවකාලිකව සකස් කර ගත යුතුය.)/ ඇහැලියගොඩ සතිපොල භූමියේ වැසිකිළිය/ කොහිලදෙණිය අපද්‍රව්‍ය මධ්‍යස්ථානය (ගොඩනැගිල්ල රහිත) අක්කර 01 ක බිම් කොටස/යන දේපල බදු දීම සඳහා ලංසුපත් විවෘත කිරීමේ කමිටු වාර්තාව සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව **සභාවට යෝජනා කරනවා.**

**සභාපතිතුමා:-**

ධීවර සංස්ථාව උඩ කොටස නොයෙක් අය විවිධ දේ සිදුකරගෙන යනවා. අපට එයින් කිසිඳු ආදායමක් නැහැ.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ලෙහි සෑම කාමරයක්ම ජරා ජීර්ණ වී තිබෙනවා. එමෙන්ම පොළට යාම සඳහා වෙනම මාර්ගයක් ඉදි වෙනවා නම් එම ගොඩනැගිල්ලෙහි වටිනාකම වැඩි වෙන බව මම සිතනවා.

සභික සුමිත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා:-

එතුමාගේ අදහසට මමත් එකඟ වෙනවා. එම කඩ පිටුපසින් අඩි 08ක පමණ කුඩා බිම් තීරුවක් තිබෙනවා.සමහර කඩ හිමියන් අනවසර ඉදිකිරීම් සිදුකර තිබෙනවා. එම මාර්ගය අප ලබාගතහොත් පොළට යාමට වෙනම මාර්ගයක් නිර්මාණය වෙනවා. එම ගොඩනැගිල්ලෙහි වටිනාකම වැඩිවෙනවා.

**සභාපතිතුමා:-**

එම බිම් කොටස ලබාගැනීමට අපි උත්සාහ දරමු.

**සභික මොහොමඩ් රාෆි මැතිතුමා :-**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව,** ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට අයත් ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ල පළමු මහල /ඇහැලියගොඩ සතිපොල ඉදිරිපිට ඇති (ඩීප් කෝනර් ආයතනයට යාබද ) බිම් කොටස / ප්‍රාදේශීය සභා වෙළඳ සංකීර්ණයේ ධීවර සංස්ථා මාළු අලෙවිසැල උඩ කොටස (සභාවේ සැලසුමට අනුව, ලබාගන්නා ලංසුකරු විසින් තාවකාලිකව සකස් කර ගත යුතුය.)/ ඇහැලියගොඩ සතිපොල භූමියේ වැසිකිළිය/ කොහිලදෙණිය අපද්‍රව්‍ය මධ්‍යස්ථානය (ගොඩනැගිල්ල රහිත) අක්කර 01 ක බිම් කොටස/යන දේපල බදු දීම සඳහා ලංසුපත් විවෘත කිරීමේ කමිටු වාර්තාව සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව**ඒකමතිකව සහා සම්මත විය.**

## VII.

**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ල පළමු මහල / ඇහැලියගොඩ සතිපොල භූමියේ වැසිකිළිය/ කොහිලදෙණිය අපද්‍රව්‍ය මධ්‍යස්ථානය (ගොඩනැගිල්ල රහිත) අක්කර 01 ක බිම් කොටසසඳහා ලංසුපත් ඉදිරිපත් නොවූ බැවින් , ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ල වසර 05 ක් සඳහා බදු ලබා දීමට අනුමැතිය ලබා ගැනීමත් ,කොහිලදෙණිය අපද්‍රව්‍ය** මධ්‍යස්ථානය **(ගොඩනැගිල්ල රහිත) අක්කර 01 ක බිම් කොටස වගා කටයුතු සඳහා බදු ලබා දීමත් සම්බන්ධයෙන් මහා සභාව මඟින් තීරණයක් ගැනීම සුදුසු බවට වන යෝජනාව - ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා:-**

**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ල පළමු මහල / ඇහැලියගොඩ සතිපොල භූමියේ වැසිකිළිය/ කොහිලදෙණිය අපද්‍රව්‍ය මධ්‍යස්ථානය (ගොඩනැගිල්ල රහිත) අක්කර 01 ක බිම් කොටසසඳහා ලංසුපත් ඉදිරිපත් නොවූ බැවින් , ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ල වසර 05 ක් සඳහා බදු ලබා දීමට අනුමැතිය ලබා ගැනීමත් ,කොහිලදෙණිය අපද්‍රව්‍ය මධ්‍යස්ථානය (ගොඩනැගිල්ල රහිත) අක්කර 01 ක බිම් කොටස වගා කටයුතු සඳහා බදු ලබා දීමත් සම්බන්ධයෙන් මහා සභාව මඟින් තීරණයක් ගැනීම සුදුසු බවට වන යෝජනාව සභාවට යෝජනා කරනවා.**

**සභික සුමිත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා:-**

**එම යෝජනාව මම ස්ථිර කරනවා.**

**ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ල සඳහා මෙවරත් ලංසු කැඳවා තිබුණා. ගැනුම්කරුවෙක් පැමිණියා.සම්පූර්ණ ගොඩනැගිල්ල නොවෙයි පළමු මහල පමණයි අපි ලබාදීමට තීරණය කර තිබුණේ.පළමු මහල වුවත් ලබාගැනීමට ඔහු කැමැත්තෙන් සිටිනවා. වසර දහයකට අධික කාලයක සිට එය එකම තැන විනාශ වෙමින් පවතිනවා. සභාවට අදායමක් ලබාගත හැකියි. එම නිසා එම කටයුතු කඩිනම් කරන ලෙස ඉල්ලීම මම සිදුකරනවා.**

**සභික පී.ආරියවංශ මැතිතුමා:-**

**මෙය හොඳ යෝජනාවක්. නමුත් මෙමඉල්ලීම පනත අනුව එකඟ නැහැ.පනතෙහි තිබෙන්නේ අපට බදු ලබාදීමට හැකියාව තිබෙන්නේ අවුරුදු 03ක් සඳහා පමණයි කියා.ඊට වඩා ලබාදිය නොහැකියි. එලෙස ලබා දෙනවා නම් පළාත් පාලන කොමසාරිස්තුමාගේ පූර්ණ අනුමැතිය ලබාගත යුතුයි. එමෙන්ම මෙම යෝජනාවට මම අලුතින් එක්කරනවා කොහිලදෙණිය අපද්‍රව්‍ය මධ්‍යස්ථානය (ගොඩනැගිල්ල රහිත) අක්කර 01 ක බිම් කොටස අවුරුදු 03කට ලබාදීම සුදුසුයි කියා මම සිතනවා.**

**සභාපතිතුමා :-**

**අපි මෙම යෝජනාව සභා සම්මත කර නියමිත ක්‍රමවේදයන් ඔස්සේ ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කරනු ලබනවා.වසර 05කට ලබාදී ගිවිසුමක් අනුව ඉදිරි කටයුතු සිදුකරනවා.**

**සභික පී.ආරියවංශ මැතිතුමා:-**
**එලෙස සිදුකරනවා නම් හොඳයි.**

**සභික මොහොමඩ් රාෆි මැතිතුමා:-**

කොහිලදෙණිය අපද්‍රව්‍ය **මධ්‍යස්ථානය** (ගොඩනැගිල්ල රහිත) අක්කර 01 ක බිම් කොටස වසර 03කට හෝ 05කට ලබාදිය යුතුයි. ඔවුන් බලාපොරොත්තු වන්නේ එලෙසයි. එවිට ව්‍යාපාරික මහතෙක් ඉක්මනින් සොයා ගැනීමට හැකි වේවා. වසරින් වසර මාරු කිරීමට ගියහොත් එය ලබා ගන්නා අය කැමති වෙන්නේ නැහැ.සභාවේ පනත අනුව කොමසාරිස්තුමා හරහා හෝ එය දීර්ඝ කරනවා නම් අපට ව්‍යාපාරිකයෙක් සොයා ගැනීම පහසුයි.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

කොහිලදෙණිය අපද්‍රව්‍ය **මධ්‍යස්ථානය** (ගොඩනැගිල්ල රහිත) අක්කර 01 ක බිම් කොටසෙහි ස්ථිර පොල් වගාවක් අප විසින් සිදුකර එහි අතුරු වගාවක් ලෙස මඤ්ඤොක්කා,කෙසෙල් වැනි දෑ සිටුවිය හැකියි.එවැනි දෙයක් සිදුකලහොත් ඉදිරියේදී වඩාත් වාසිදායක වේවි.

**සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-**

අද දින අප විසින් ලබාගන්නා තීන්දු තීරණ තව අවුරුදු 05කටත් වලංගු වන දෙයක්. හෙට අනිද්දා අපි සිටිද දන්නෙත් නැහැ.අප ගන්නා තීරණ අනුව සිටින අයට තමා වැඩකටයුතු කිරීමට සිදුවන්නේ. අපට තවම මළ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයක් සකසා ගැනීමට නොහැකි වුණා. මම මෙයට විරුද්ධව කතා කරනවා නොවෙයි. අද මෙම තීරණය ලබාගතහොත් කවදා හෝ මෙහි නැවත පත් වී පැමිණෙන අයට මුදල් ලැබුණහොත් ඔවුන්ට අවස්ථාව නොමැති වෙනවා එහි මළ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයක් සැකසීමට.

**සභාපතිතුමා :-**
අපට අයත් භූමි තව විශාල ප්‍රමාණයක් විවිධ ගම්මාන වල තිබෙනවා.

**සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-**
ඒවා ප්‍රාදේශිය සභාවේ වත්කම් ලේඛනයේ සඳහන්ව තිබෙනවාද?

**සභාපතිතුමා :-**
ඔව්. එම කොහිලදෙණිය අපද්‍රව්‍ය මධ්‍යස්ථානය (ගොඩනැගිල්ල රහිත) අක්කර 01 ක බිම් කොටස ඝන කැළැවක් බවට පත්වී කිසිඳු ප්‍රයෝජනයක් ලබාගත නොහැකිව තිබෙන්නේ. එම නිසාම තමා අපි ආදායම් උත්පාදන වැඩසටහනක් සඳහා යොදා ගමු කියා තීරණය කර තිබෙන්නේ. එම නිසා ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ කටයුතු බේරුවානෙහි සිදුකරගෙන යනවා. ජීව වායු සඳහා එහි ඉඩකඩ ප්‍රමාණවත් බව පැවසුවා.එම නිසා එය වෙනස් කල නොහැකියි.

**සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-**

ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ල මෙන් ගැටළුකාරී නොවන විනිවිද භාවයෙන් යුතු හොඳ ගිවිසුමක් සකස්කර අනාගතයේ පත්වී පැමිණෙන මන්ත්‍රීතුමන්ලාටත් බලපෑමක් ඇතිකල හැකි රෙගුලාසි ඇතුලත් කළහැකි පරදි සකසා එම එකඟතාවයන් සඳහා එළඹෙනවා නම් සුදුසුයි කියන යෝජනාව මම සිදුකරනවා.

**සභාපතිතුමා :-**

අනිවාර්යයෙන්ම අප එය සිදුකිරීමට බලාපොරොත්තු වෙනවා. එම ගිවිසුම සම්බන්ධව සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා දැනුවත්කර තමා ඉදිරි වැඩකටයුතු සිදුකරනු ලබන්නේ.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ල පළමු මහල / ඇහැලියගොඩ සතිපොල භූමියේ වැසිකිළිය/ කොබිලදෙණිය අපද්‍රව්‍ය මධ්‍යස්ථානය (ගොඩනැගිල්ල රහිත) අක්කර 01 ක බිම් කොටසසඳහා ලංසුපත් ඉදිරිපත් නොවූ බැවින් , ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ල වසර 05 ක් සඳහා බදු ලබා දීමට අනුමැතිය ලබා ගැනීමත් ,කොබිලදෙණිය අපද්‍රව්‍ය මධ්‍යස්ථානය (ගොඩනැගිල්ල රහිත) අක්කර 01 ක බිම් කොටස වගා කටයුතු සඳහා වසර 05කට බදු ලබා දීමත් සම්බන්ධයෙන් මහා සභාව මඟින් තීරණයක් ගැනීම සුදුසු බවට වන යෝජනාව ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව අවශ්‍ය කටයුතු සිදුකිරීමට ඒකමතිකව සභා සම්මත විය.**

**viii. ඇහැලියගොඩ සතිපොළ භූමිය බස්නැවතුම්පලක් ලෙස යොදාගැනීම සම්බන්ධයෙන් 2023-01-24 වන දින පැවති සාකච්ඡාවේ වාර්තාව සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව - ගරු සභාපතිතුමා**

**සභාපතිතුමා:-**

**ඇහැලියගොඩ සතිපොළ භූමිය බස්නැවතුම්පලක් ලෙස යොදාගැනීම සම්බන්ධයෙන් 2023-01-24 වන දින පැවති සාකච්ඡාවේ වාර්තාව සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව** සභාවට යෝජනා කරනවා.

**සභාපතිතුමා:-**

මෙහිදී මෙම කමිටු සභාපතිත්වය දැරූ හරිස් කිරිඇල්ල මන්ත්‍රීතුමා ඇතුළු කමිටු සාමාජිකයින් පිරිස එම ස්ථානයට ගොස් සොයා බලා අවශ්‍ය ලෙස එම තීන්දු තීරණ රැගෙන මේ ආකාරයෙන් වැඩකටයුතු සිදුවිය යුතුයි කියා අපට වාර්තාවක් ලබා දුන්නා.මම පවසා සිටියා මෙම කමිටුව විසින් ලබාගන්නා තීන්දු තීරණ යම් හෙයකින් වෙනස් වන්නේ නම් ,ඒ සඳහා කමිටුවේ උපදෙස් ලැබිය යුතුයි. නැතිනම් ඒවා මාහට වෙනස් කල නොහැකියි.බස් නැවතුම්පල සම්බන්ධයෙන් මා හට විවිධ බලපෑම් පැමිණියා. අදත් පැමිණියා.දිනපතාම එනවා. නිවසට එනවටනම් මම කැමති නැහැ. මක් නිසාද එම බස් රථ සම්බන්ධයෙන් විවිධ දේ සිදුව තිබෙනවා. එහෙත්, ප්‍රාදේශිය සභාවේ මා ඇතුළු සියලු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ඉතාමත් ගෞරවාන්විත ලෙස එම කටයුතු සිදු කළා මිසක,අප වෙනත් පැති දෙසට යොමු වූයේ නැහැ. මෙය ඉතාම හොඳ වැඩක් එමනිසා මෙය විය යුතුයි කියන මතයේම අපි සිටියා. මම ඇහැලියගොඩ -රත්නපුර සහ අවිස්සාවේල්ල- රත්නපුර බස් රථ සඳහා දැනුම් දී තිබෙනවා පොළ භූමියට එම රථ ගෙන යන ලෙස.එම ගැටළුව සඳහාත් අවශ්‍ය කටයුතු සිදුකිරීමට මම බලාපොරොත්තු වෙනවා. බස් රථ රියදුරන්ට සහ බස් රථ හිමියන්ට නගරයක් පාලනය කිරීමට නොහැකියි. නගරය පාලනය කිරීමට එක් පුද්ගලයෙක් පමණයි සිටිය හැක්කේ. නමුත් ඒවාට අවනත නොවී තීන්දු තීරණ ගන්නවා නම්. එම හිතුවක්කාර තීරණ ගන්නා පුද්ගලයා මෙහි වාඩි විය යුතුයි. මෙහි සිටින පුද්ගලයාට එම කාර්යය සිදුකිරීමට නොහැකිනම් ඔහු ගෙදර යා යුතුයි.මෙම ලබාගත් තීරණය පිළිබඳ කිසිසේත්ව අඩිය පසුපසට ගන්නේ නැහැ. මම මෙම ගෞරවනීය මහ සභාවේ ගන්නා තීන්දු අනුවයි කටයුතු සිදුකරන්නේ. ඉන් එහා දෙයක් සිදුකරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මිනිසුන් චෝදනා නගන්නේ වැසිකිළියක් නැහැ කියා. නගරයේ වැසිකිළිය තිබිය යුතු ස්ථානයේ තිබෙනවා.බස් නැවතුම්පල සෑදීමට යෝජිත භූමියේ එම පහසුකම තිබෙනවා. නමුත් බස් රථ හිමියන් එම ස්ථානයට යාමට මැලිකමක් දක්වනවා. ඔබගේ අදහස් අනුව සියලු පහසුකම් මම එහි ඇති කිරීමට බලාපොරොත්තු වෙනවා.පුද්ගලික ආයතන වලින්ද අවශ්‍ය සහාය ලබාදෙන බව පැවසුවා. ඉදිරියේදී නල ළිඳක් මාර්ගයෙන් ජලය ලබාගෙන අතිරික්ත ජල ප්‍රමාණයක් තිබේනම් එයිනුත් ආදායමක් සභාවට ලබාගැනීමට කටයුතු සූදානම් කරනවා.

**සනික ආර්.ධනරත්න මැතිතුමා:-**

**එම යෝජනාව මම ස්ථිර කරනවා.**

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, ඇහැලියගොඩ සතිපොළ භූමිය බස්නැවතුම්පලක් ලෙස යොදාගැනීම සම්බන්ධයෙන් 2023-01-24 වන දින පැවති සාකච්ඡාවේ වාර්තාව සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**IX. 2022 භාණ්ඩ සමීක්ෂණය අනුව, එම සමීක්ෂණ වාර්තාවේ වෙන්දේසි කළ යුතු ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ වෙන්දේසි කිරීමටත්, විනාශ කිරීමට ඉදිරිපත් කර ඇති ලැයිස්තුවේ සඳහන් ඖෂධ, භාණ්ඩ හා පොත් විනාශ කිරීමටත්, ඌන භාණ්ඩ හා පොත් වෙනුවෙන් මුදල් අය කිරීමටත්, අබලි ද්‍රව්‍ය වෙන්දේසි කර ඉතිරි වන ඒවා විනාශ කිරීමටත්, ඉදිරිපත් කර ඇති අනෙකුත් නිර්දේශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඒවා ක්‍රියාත්මක කිරීමටත් සඳහා වන යෝජනාව**

**සභාපතිතුමා :-**

**2022 භාණ්ඩ සමීක්ෂණය අනුව, එම සමීක්ෂණ වාර්තාවේ වෙන්දේසි කළ යුතු ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ වෙන්දේසි කිරීමටත්, විනාශ කිරීමට ඉදිරිපත් කර ඇති ලැයිස්තුවේ සඳහන් ඖෂධ, භාණ්ඩ හා පොත් විනාශ කිරීමටත්, ඌන භාණ්ඩ හා පොත් වෙනුවෙන් මුදල් අය කිරීමටත්, අබලි ද්‍රව්‍ය වෙන්දේසි කර ඉතිරි වන ඒවා විනාශ කිරීමටත්, ඉදිරිපත් කර ඇති අනෙකුත් නිර්දේශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඒවා ක්‍රියාත්මක කිරීමටත් සඳහා වන යෝජනාව** සභාවට යෝජනා කරනවා.

**සභික පී.ආරියවංශ මැතිතුමා**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, 2022 භාණ්ඩ සමීක්ෂණය අනුව, එම සමීක්ෂණ වාර්තාවේ වෙන්දේසි කළ යුතු ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ වෙන්දේසි කිරීමටත්, විනාශ කිරීමට ඉදිරිපත් කර ඇති ලැයිස්තුවේ සඳහන් ඖෂධ, භාණ්ඩ හා පොත් විනාශ කිරීමටත්, ඌන භාණ්ඩ හා පොත් වෙනුවෙන් මුදල් අය කිරීමටත්, අබලි ද්‍රව්‍ය වෙන්දේසි කර ඉතිරි වන ඒවා විනාශ කිරීමටත්, ඉදිරිපත් කර ඇති අනෙකුත් නිර්දේශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඒවා ක්‍රියාත්මක කිරීමටත් සඳහා වන යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**හදිසි යෝජනා**

01.සභාවේ ආදාහනාගාරය සතුව තිබෙන්නේ 37.5kg ලිට්රෝ සිලින්ඩර් 05ක් පමණි. එහි ඇති ගෑස් ප්‍රමාණය අවසන් වන තෙක් නව ගෑස් ටැංකි ලබා ගැනීමට නොහැකිය. ආදාහනාගාරයේ මෘත දේහයන් ආදාහන කටයුතු මේ දිනවලදී කරගෙන යයි. සිකුරාදා දිනයකදී ගෑස් ටැංකිවල ගෑස් අවසන් වුවහොත් නැවත චෙක්පත් ලබාදී ගෑස් ලබාගැනීමට හැකි වන්නේ ඊළඟ වැඩකරන දිනයකදීය. බොහෝ දුරට එය සඳුදා දිනය වේ. සභාව හා ජනතාව පත්වන මෙකී අපහසුතාවය මගහරවා ගැනීම සඳහා රුපියල් ලක්ෂ 03ක ඇපයක් හෝ ගෑස් ටැංකි 15ක මුදල රත්නපුර දිස්ත්‍රික් අලෙවි නියෝජිත ජේ.කේ.ඉන්ඩස්ට්‍රීස් ආයතනය වෙත තැබීමෙන් ඇතිවිය හැකි ගැටළුකාරී තත්වය මගහරවා ගැනීමට හැකි වේ**. මේ සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.**

සභික අශෝක ගුණරත්න මැතිතුමා:-

එම යෝජනාව මම ස්ථිර කරනවා.

සභාපතිතුමා:-

බොහෝමයක් අඩුපාඩු මැද තමා අපි ආදාහනාගාරයේ වැඩකටයුතු සිදුකරගෙන යනු ලබන්නේ.විශාල ජනතාවක් ජීවත්වන විලේගොඩ ප්‍රදේශයට කනත්තක් පමණයි තිබෙන්නේ. එහිත් දේහයන් භූමදානය කිරීමට ඉඩක් නැහැ. එම නිසා එම ප්‍රදේශය නියෝජනය කරන මහජන නියෝජිතයින් මෙන්ම ජනතාව දිගින් දිගටම ඉල්ලීම් ඉදිරිපත් කළා ආදාහනාගාරයේ වැඩ කටයුතු හැකි ඉක්මනින් සිදුකරන ලෙසට. එබැවින් අප, අඩුපාඩු මැද වුවද එම කටයුතු සිදුකර තිබෙනවා.අපට සියලු දෙනාම වැදගත්.එම නිසා වැදගත් ලෙස දේහයන් ආදාහනය කළ යුතු වෙනවා. නමුත් අපි තවම ටයිල් ඇල්ලීම සිදුකර නැහැ. මෙම කටයුතු සම්පූර්ණ කරගැනීමට නොහැකි වීම පිළිබඳව අප කනගාටුවට පත් වෙනවා. මේ නිසා යම් අවස්ථාවන් වලදී ජනතාව අපහසුතාවයට පත්විය හැකියි. මානුෂීය සහ ජනතාවගේ අත්‍යවශ්‍ය හේතූන් නිසා දාහන කුටීය වැඩකටයුතු සම්පූර්ණ කර ආදාහන කටයුතු අප ආරම්භකර තිබෙනවා.එමනිසා යම් කිසි කෙනෙක් අපහසුතාවයට පත්වෙනවා නම් අප සභාවක් ලෙස කනගාටුවට විය යුතුයි. ඉදිරියේදීත් එම අඩුපාඩු සියල්ල සම්පූර්ණ කර ජනතාවට තම මියගිය පුද්ගලයා ආදාහනය කිරීමට ඉතාමත් හොඳ ආකාරයට අවශ්‍ය කටයුතු සලසා දීමට බලාපොරොත්තු වෙනවා.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

අපි කෝටි ගානක් වියදම්කර ,විශාල කාලයක් ප්‍රමාද වී හානිදායක තත්වයක් සිදු වුණේ.මම ලේකම්තුමා සමඟ කථා කළ විට එතුමා පැවසුවා හෙට අනිද්දා වන විටම වැඩකටයුතු ආරම්භ කරන බව. එතුමාගේ උනන්දුව සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා,සතුටු වෙනවා. ගොඩනැගිල්ලෙහි වැඩ කටයුතු අංග සම්පූර්ණව සිදුකිරීමට අපට නොහැකි වුවත් ,එමගින් විශාල හානියක් වන්නේ නැහැ. කෙසේ වෙතත් සභාවේ ආදායම් මාර්ගය පිළිබඳවත් සැලකීමේදී මෙම කටයුතු සිදුකිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

**සභික තිලක් හොරගොඩ මැතිතුමා:-**

එම කටයුතු සිදුකිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ආදාහනාගාරයේ ඉදිරිපස කොටසේ දේහයන් තැන්පත් කිරීමට සුදුසු ලෙස සකසා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, සභාවේ ආදාහනාගාරය සතුව මේවන විට තිබෙන ගෑස් සිලින්ඩර ප්‍රමාණය 37.5Kgක් පමණ වන බැවින් ගෑස් ටැංකි ප්‍රමාණය අවසන් වනතුරු ගෑස් මිලදී ගැනීමට නොහැකිය. සති අන්ත දිනකදී ගෑස් ටැංකි ප්‍රමාණය අවසන් වුවහොත් චෙක්පත් ලබාදී ගෑස් ලබාගැනීම සඳහා ඊළඟ වැඩකරන දිනය වනතුරු බලා**

**සිටීමට සිදුවේ.සභාව හා ජනතාව පත්වන අපහසුතාවය මගහරවා ගැනීම සඳහා රු.ලක්ෂ 03ක ඇපයක් හෝ ගෑස් ටැංකි 15ක මුදල රත්නපුර දිස්ත්‍රික් අලෙවි නියෝජිත ජේ.කේ.ඉන්ඩස්ට්‍රීස් ආයතනය වෙත තැබීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

02. **ඇහැලියගොඩ පොලේ වැසිකිලිය අලුත්වැඩියාව හා කාණු සඳහා කොන්ක්‍රිට් තට්ටු දැමීම සඳහා වන රු.775,000.00 වියදම් ඇස්තමේන්තුව සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.**

සභික **එස්.කරුණාදාස මැතිතුමා:-**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.
නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, ඇහැලියගොඩ පොලේ වැසිකිලිය අලුත්වැඩියාව හා කාණු සඳහා කොන්ක්‍රිට් තට්ටු දැමීම සඳහා වන රු.775,000.00 වියදම් ඇස්තමේන්තුව සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**සභාපතිතුමා :-**
**ගරු ලේකම්තුමාට අදහස් ඉදිරිපත් කිරීමට තිබෙනවා ආදාහනාගාරය සහ කසළ ඉවත් කිරීම සම්බන්ධව.ඒ සඳහා අවස්ථාව ලබාදීමට මහ සභාව කාරක සභාවක් ලෙස යෝජනා කරනවා.**

**සභික සුමිත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා:-**

**එම යෝජනාව මම ස්ථිර කරනවා.**

**ඒ අනුව මහ සභාව කාරක සභාවක් බවට පත්විය.**

**සභාපතිතුමා :-**
**කාරක සභාව මහ සභාවක් බවට යෝජනා කරනවා.**

**සභික රසිකා වසන්ති සිරිවර්ධන මැතිනිය:-**

**එම යෝජනාව මම ස්ථිර කරනවා.**

**කාරක සභාව මහ සභාවක් බවට පත්වීමෙන් අනතුරුව මහා සභාවේ වැඩ කටයුතු නැවත ආරම්භ විය.**

**6.** කාරක සභා වාර්තා

i. 2023-01-10 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව - ගරු සභාපතිතුමා
ii. 2023-01-18 දිනැති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව - ගරු සභාපතිතුමා
iii. 2023-01-16 ප්‍රසම්පාදන කමිටුව - ගරු සභාපතිතුමා.
iv. 2023-02-01 නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව - ගරු සභාපතිතුමා.
v. කාර්මික සේවා කමිටුව - නොපැවැත්විණි.
vi. පරිසර හා පහසුකම් කමිටුව -නොපැවැත්විණි.
vii. විදුලිය,ජලය,රථවාහන නැවතුම් ,පදික වෙළඳාම පිළිබඳ උපදේශක කාරක සභාව - නොපැවැත්විණි.
viii. සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව - නොපැවැත්විණි

**7. ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා**

- ප්‍රා.ස.14 හා 16 (ජනවාරි මස) මහා සභා අනුමැතියට යෝජනා කරමි.
- හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.

**සභාපතිතුමා :-**

ප්‍රා.ස.14 හා 16 (ජනවාරි මස) , හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරනවා. එමෙන්ම 2023-12-31 යනුවෙන් සඳහන් වී ඇති මෙම වාර්තාව 2023-01-31 යනුවෙන් නිවැරදි විය යුතුයි.

**සභික පී.ආරියවංශ මැතිතුමා:-**

එම යෝජනාව මම ස්ථිර කරනවා. ආදායමට වඩා වියදම වැඩි වී තිබෙනවා. එයට හේතුව දෙසැම්බර් මස ණය හිමි ප්‍රමාණය වැඩි වූ බව සොයාගත්තා. ජල පාරිභෝගික ගාස්තු ආදායම් අඩුයි. බදු මුදල් එකතු කිරීමේ ප්‍රවනාතවය මීට වඩා වැඩි විය යුතුයි. හිඟ වරිපනම් පිළිබඳව මීට වඩා අවධානය යොමුකල යුතු

වෙනවා. අවුරුද්දේ යම් කිසි කාලසීමාවක් තිබෙනවා වරිපනම්අයකල යුතු. එම කාර්යයන් නිසි ලෙස සිදුවී නැති බව පෙනී යනවා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දැනුම්දෙන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

**ඒ අනුව, ප්‍රා.ස.14 හා 16 (ජනවාරි මස) හා හිඟ ආදායම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-**

මම ගියවර සභාවේදී විමසුවා අවුරා ලංකා සැණකෙළියේ ලැබූ ආදායම කොපමණද කියා. එය කුමන වැය ශීර්ෂය යටතේද පෙන්වා ඇත්තේ කියා දැනගැනීමට කැමතියි.

**සභාපතිතුමා:-**

අවුරා ලංකා කියා වැය ශීර්ෂයක් නැහැ.විෂය නිලධාරී සතුව සියලු විස්තර තිබෙනවා.විෂය නිලධාරීන්ගෙන් දැනගන්න.

**සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-**

විෂය නිලධාරීන් කැඳවා පැහැදිලි කරන්න

**සභාපතිතුමා:-**

මෙවැනි ගැටළු තිබේනම් කල් ඇතුව සභාවට ඉදිරිපත් කරන්න.

**-සභාව තුළ ඝෝෂාව-**

සභික හරිස්චන්ද්‍ර කිරිඇල්ල මැතිතුමා:-

අවුරා ලංකා සැණකෙළිය සහ සංගීත ප්‍රසංගය ඇහැලියගොඩ නගරයේ පවත්වන බව දැනගත් විගස දිලීන් කරුණාපාල මන්ත්‍රීතුමා මෙම මහා සභාවෙන් ඒ පිළිබඳව විමසීමක් කළා. පසුව අපි සාකච්ඡාවක් සඳහා එහි අධිපතිතුමා කැඳවූවා. නමුත් එතුමා පැමිණියේ නැහැ. එතුමාගේ සහකාර ලේකම්වරු තමයි පැමිණියේ. ඒ පිළිබඳව උනන්දුවක් දක්වන ගරු මන්ත්‍රීතුමන්ලාත් සහභාගී වුණා. අපි එම සාකච්ඡාව සද්භාවයෙන් පැවැත්වූවා. ඔවුන් සමඟ සාකච්ඡාකර තිබූ ගැටළු නිරාකරණය කරගත්තා. අපේ ප්‍රාදේශිය සභා පනත අනුව ඕනෑම පළාත් පාලන ආයතනයකට මුදල් ලබාගැනීමට නොහැකි ආකාරයට ශුක්ෂමව සැලසුම්කර තමා ඔවුන් මෙම ප්‍රසංගය සිදුකරනු ලබන්නේ.අපි අපේ නිලධාරීන් යොදවා අපට මුදල් ලබාගත හැකි සෑම ක්‍රමවේදයක්ම සොයා බැලුවා. නමුත් අවාසනාවකට ඔවුන් විශාල ලාභයක් ලබා ඇහැලියගොඩින් යනවිටත් අපේ ප්රාදේශිය සභාවට නීත්‍යානුකූලව මුදල් ලබාගැනීමේ ක්‍රමවේදයක් තිබුනේ නැහැ.මෙම වැඩසටහනෙහි මුල සිට අග දක්වාම සිටි පුද්ගලයෙක් ලෙසයි මම මෙය කියන්නේ.බලෙන් මුදල් ගන්න බැහැ. පළාත් සභාවේ ආදායම් පරිපාලකතුමා පැවසුවා මෙයින් මුදල් ලබාගැනීමේ ක්‍රමවේදයක් නොමැති බව. මුදල් කොපමණ ගත්තාද? ඇයි මුදල් ගත්තේ නැත්තේ ? කියා නොවෙයි විමසිය යුත්තේ. අපේ පනත අපි වෙනස් කරගත යුතුයි. නැතිනම් මීළඟට පැමිණෙන කානිවල් එකෙනුත් අපට විනෝද බදු අයකර ගැනීමට අවස්ථාවක් නොලැබේවි.එසේනම් අප දැනගත යුතුයි ඔවුන් යාවත්කාලීන වෙනවා නම්, අපිත් අපේ අසූ ගණන්වල යල්පැන ගිය විනෝද බදු ක්‍රමවේදය නැතුව අපිත් අනු නීති සාදාගත යුතුයි. මේ පිළිබඳව ඉහළ නිලධාරීන් දැනුවත් කිරීම ලේකම්තුමා ඇතුළු නිලධාරීන්ගේ යුතුකමක්. ඔවුන්ගේ උපදෙස් අනුව මෙම මුදල් ලබාගැනීමට ක්‍රමවේදයක් සැකසිය යුතුයි. මීට පෙර සැණකෙළි පැවැත්වූ ප්‍රාදේශිය සභාවල අයටත් අපට සිදුවූ දෙයමයි සිදුව තිබෙන්නේ. නොමිලේ සිදුකල බව පැවසුවාට මෙය පැහැදිලිවම ව්‍යාපාරයක්. සභාපතිතුමා හැකි අයුරින් අපට එම මුදල් ලබා ගැනීමේ වැඩපිළිවෙලට කැපවුණා. කසළ එකතුකිරීමට ගරු සභාපතිතුමා ලක්ෂ 10ක මුදලක් ඇස්තමේන්තුකර තිබුණා. අපි එම මුදල ලබාගැනීමට උත්සාහ කළා. නමුත් ඔවුන් එයට අකමැති වුණා. අපේ සේවකයින් එපා ඔවුන් කසළ එක් ස්ථානයකට රැස්කර දෙන බව පැවසුවා. එලෙස අඩුකර යමින් රු.265,000.00කට අඩු වුණා. එම ප්‍රසංගය හරහා ලබාගන්නා මුදලට වඩා වැඩි සංවර්ධන වැඩ කොටසකුත් අපි සභාව වෙනුවෙන් සිදුකරගෙන තිබෙනවා.එනම් මෝරගල සිට හොරගොඩ දෙසට ගමන් ගන්නා මාර්ගය බැකෝ යන්ත්‍ර යොදා සාමාන්‍ය මට්ටමකට සකසා දුන්නා. ජල පහසුකම ලබාගෙන වැසිකිළි සාදා දුන්නා.නමුත් අපි ප්‍රාදේශිය සභාවක් ලෙස අපේ නීති රීති පද්ධතියේ තිබෙන අසාර්ථකත්වය මත අපිට යහපත් ක්‍රමවේදයක් ඔස්සේ මුදල් ලබාගැනීමට හැකියාවක් නොමැති වුණා.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**

ඉහළ දේශපාලන බලය යොදාගෙන තමා මෙය සිදු කළේ. මෙමගින් සභාවට ආදායම් මාර්ගයක් තිබේද යන්න මම ප්‍රශ්න කළා. කෝටි ගානක් ඇහැලියගොඩ මුදල් ඔවුන් රැගෙන ගියා. මෙම සංගීත සංදර්ශනය නිසයි මත්ද්‍රව්‍ය භාවිතය වැඩි වශයෙන් සිදු වුණේ. අපේ නිවාස පිටුපස බෝතල් ගොඩගැසී තිබුණා. විශාල පරිසර විනාශයක් සිදු කළා.මෙයට මගේ දැඩි විරෝධය මම පළ කළා.

සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-

මෙම සැණකෙළිය මම හොඳයි කිවුවේ මෙය හොඳ ව්‍යාපාරික අවස්ථාවක් නිසා. එම වැසිකිළි නඩත්තු කරන්නේ කවුද ?, ප්‍රමිතියකටද සාදා තිබෙන්නේ? කියන ගැටළුව මිනිසුන්ට තිබෙනවා. හැකිනම් නාගරික සංවර්ධන අධිකාරියට ලිපියක් මගින් එය දැනුම් දෙන්න.

සභාපතිතුමා:-

නාගරික සංවර්ධන අධිකාරියට මම පැවසුවා ක්‍රීඩාපිටිය අපට පවරා දෙන ලෙසට.මුළු ක්‍රීඩාංගනයම අපට ලබා දුනහොත් වැසිකිළිය නඩත්තු කිරීමට අයෙක් අපට යෙදිය හැකියි. අසල මිනිසුන් මාහටද පැවසුවා

වැසිකිළිය නිවෙස් අසලට ආසන්න වැඩි බව. එවිට මම ඇසුවා ඔබේ නිවසේ වැසිකිළිය කොහෙද තිබෙන්නේ කියා. සොයා බැලූ විට එය නිවසේ මුළුතැන්ගෙය අසලමයි ඉදිකර තිබෙන්නේ. මේවා නිකන් බොළඳ කතා.

සභික අශෝක ගුණරත්න මැතිතුමා:-

මමත් අදහස් ප්‍රකාශ කරනු ලබන්නේ අවුරා ලංකා සමාගමට විරුද්ධවයි. නමුත් මිනිසුන් කුමන රසයක් සඳහා මෙයට කැමති වූවාද දන්නේ නැහැ. මෙම ගැටළුව ඇති වීමට ප්‍රධානතම හේතුව ක්‍රීඩාපිටිය අප සතු නොවීමයි. වහාම අපි ක්‍රීඩාපිටිය ප්‍රාදේශීය සභාවට පවරාගෙන නිදහස්කරගත යුතුයි. අපේ ක්‍රීඩාපිටිය UD එකට පොළ සැදීමට දුන්විට ඔවුන් නැවත අපට ක්‍රීඩාපිටියක් සාදා දෙන බව පැවසුවා. එය අප සතු වූවානම් යම් යම් සීමාවල් අපට පැනවීමට ඉඩ තිබුණා. විදුලි බල්බ් යොදන විටයි අප දන්නේ මෙවැනි සැණකෙළියක් පැවැත්වෙන බවත්. ටිකට් දිනුම් ඇදීමක් වූවත් දිනපු අයත් සොයා ගැනීමට නැහැ.එක් අතකින් ඇහැලියගොඩ නගරයට විශාල අසාධාරණයක් සිදු වුණා. අනෙක් අතින් මිනිසුන් එයින් වින්දනයකුත් ලබාගත්තා . අපි එයට ක්‍රමවේදයක් සාදා නොගැනීම ගැටළුවක් .මේ පිළිබඳ දිගින් දිගට කතා කිරීමත් ඵලක් නැහැ.

සභාපතිතුමා:-

මෙම අවුරා ලංකා සිද්ධිය පිළිබඳව හැම සභාවකදිම කතා කරනවා. මේ දෙස දුර්වල ලෙස බලන මන්ත්‍රීතුමන්ලා කුමන හේතුවක් නිසා දුර්වල ලෙස බලනවාද කියා මට වැටහෙන්නේ නැහැ.ඒ අය පිළිබඳව වගකීම් දැරීමට බැහැ. අවුරා ලංකා වැඩසටහනට මෙම සභාවේ කිසිම අයෙක් අනවශ්‍ය ලෙස මැදිහත් නොවූ බව මම වගකීමෙන් කියා සිටිනවා. නමුත් අනශ්‍ය ලෙස ගනුදෙනු පිළිබඳව ඒවා ලබා නොදීම සම්බන්ධව විරසක වූ අය සිටිනවා නම් ඒවායේ වගකීම මට දරන්නට බැහැ.මෙම වැඩසටහන පිළිබඳව තමන්ට ගැටළුවක් තිබෙනවා නම් යා හැකි තැන් ඕනෑතරම් තිබෙනවා. මම වගකීමෙන් එය කියා සිටින්නේ. අධිකරණයට හෝ ගොස් එම චෝදනා නිවැරදි කරන ලෙස මම කියා සිටිනවා.අපට අනවශ ගැටළු භාරගැනීමට බැහැ. ඒ අය එක් එක් අයගෙන් උපදෙස් ලබාගෙන ප්‍රාදේශිය සභාවට ආදායම් නොගවා සිටීමට සූක්ෂම ලෙස උපදෙස් ලබාගෙන තිබුණා. රජයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් තමා පත්කරගෙන සිටින්නේ. අප සභාවට නීත්‍යානුකූල ලෙස ලබාගත හැකි ආදායම් ලබාගත්තා. මම මෙය කිව යුතුයි. එදත් ,අදත්,දැනුත් මෙයට සම්පූර්ණයෙන්ම විරුද්ධව ධනරත්න මන්ත්‍රීතුමා කතා කළා. නමුත් අපි පාරට ගොස් විරුද්ධ බව පැවසුවා නම් ලක්ෂ සංඛ්‍යාත මිනිසුන් අපේ නිවෙස් වලටත් ගල් ගසාවි මෙවන් දෙයක්වත් නැරඹීමට නොදෙනවාය කියා.ඒ ආකාරයෙනුත් විය හැකියි. දිලීන් මන්ත්‍රීතුමා එක් අවස්ථාවක ෆේස් බුක් හරහා යෙදු දෙයකට පහර ගසා තිබූ හැටි අපි දුටුවා. එමනිසා අප මෙය ඉතාමත් කල්පනාවෙන් සිදුකල යුතුයි. කුමන ආයතනයෙන් පැමිණ කුමන වැඩසටහන සිදු කලත් අප ලබාගත හැකි ආදායම් අප ලබාගන්නවා. සෑම දෙයක්ම අප කළේ නීත්‍යානුකූල ලෙස .මම එය වගකීමෙන් කියනවා. ඇහැලියගොඩ ජාතික පාසලෙන් පැවැත්වූ ප්‍රසංගයෙන් අපට ලැබිය යුතු විනෝද බදු නොගෙවා සිටියා. හිතුවක්කාර ලෙස සෑම තැනම ටිකට් විකුණුවා.නමුත් අපි අනුකම්පා කරලා අපට ලැබිය යුතු මුදල පමණක් ලබාගත්තා. ජාතික පාසල අපි ජාතික පාසලට දෙන සහන තඹ සතේකට ගණන් ගන්නේ නැහැ. මොන අපහසුතාවය තිබුණත් මම නීත්‍යානුකූලව වැඩ කටයුතු කරගෙන යනවා. මම සෑම විටම ඉතාම පිරිසිදුව වැඩකිරීමට කැමති කෙනෙක්. මේ සභාවේ වැඩ කටයුතු අපහසුතාවයට පත්කිරීමට යම් කෙනෙක් උත්සාහ දරනවා නම් ඒ සෑම දෙයක්ම පරාජය කිරීමට මම සූදානම්.

**08. මහා සභාවට පැමිණිය නොහැකි බව දන්වා එවා ඇති ලිපි සභාගත කිරීම.**

**සභාපතිතුමා :-**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී චමිල් නිශාන්ත දිසානායක මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මනෝජ් ප්‍රසාද් වෙලගෙදර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී තිලක් පුෂ්පකුමාර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී මනෝරි සේනාධීර මැතිනිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී නයනි කස්තුරිආරච්චි මැතිනිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුගත් හැන්ඩ්‍රිෂන් මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී නුවන් මහේෂ් රත්නායක මැතිතුමා 2023 පෙබරවාරි මස මහා සභාවට පැමිණිය නොහැකි බව දුරකථනයෙන්, දන්වා තිබෙනවා. එම නිවාඩු අනුමත කිරිමට යෝජනා කරනවා.

**සභික රසිකා වසන්ති සිරිවර්ධන මැතිනිය**:-

අද දින නොපැමිණි මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

විරෝධතා තිබේනම් දන්වන්න.

නිහඬතාවයෙන් පෙනී යන්නේ විරෝධතා කිසිවක් නොමැති බවයි.

ඒ අනුව, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී චමිල් නිශාන්ත දිසානායක මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මනෝජ් ප්‍රසාද් වෙලගෙදර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්රී තිලක් පුෂ්පකුමාර මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී මනෝරි සේනාධීර මැතිනිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී නයනි කස්තුරිආරච්චි මැතිනිය, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුගත් හැන්ඩ්‍රිෂන් මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී නුවන් මහේෂ් රත්නායක මැතිතුමා, 2023 පෙබරවාරි මස නිවාඩු අනුමත කිරිමට ඒකමතිකව සභා සම්මත විය.

**9. වෙනත් කාරණා**

- **පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.**

**සභික පී.ආරියවංශ මැතිතුමා:-**

මාහට ලිපියක් ලැබී තිබෙනවා “හේවායින්න ආර්වේද බෙහෙත් ශාලාව 2023 වර්ෂයේදී තවදුරටත් විවෘතව තබන්නේද යන්න පිළිබඳව තීරණයක් ගැනීම පිළිබඳවයි” කියා. එහි ඇති ලේඛනයේ තිබෙනවා 2022 වර්ෂයේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා දින 40ක් ආයුර්වේදය විවෘතව තැබුවා කියා. රෝගීන් එක්

අයෙක්වත් නැහැ. මෙම ලේඛනය සම්පූර්ණයෙන්ම බොරුවක්. මක් නිසාද මම දන්නවා තරුණ ගැබිනි කාන්තාවක් තමා වෛද්‍යවරිය ලෙස එම ස්ථානයට ගියේ. එතුමියට බස් රථයෙන් බැස කිලෝ මීටර් කාලකට වැඩි ප්‍රමාණයක් පා ගමනින් එම ස්ථානයට යාමට සිදුවෙනවා. එබැවින් යාමට නොහැකියි කියා එතුමිය ගියේ නැහැ.අනෙක් කාරණය ආයුර්වේද ගොඩනැගිල්ල ටකරන් තහඩු සෙවිලි කළ වටේටත් ටකරන් සෙවිලි කළ ගොඩනැගිල්ලක්.එම ස්ථානයේ පායන කාලයට තද රස්නයක් පවතිනවා.විදුලියත් නැහැ.එම නිසා විදුලි පංකාවක්වත් භාවිතා කිරීමට නොහැකියි.රෝගීන්ට මෙන්ම වෛද්‍යතුමියටත් සිටීමට නොහැකියි. එම නිසා මෙතුමිය එහි නොගිය බව මම ප්‍රකාශ කරනවා.එමනිසා මෙවන් බොරු ප්‍රකාශ යොදා ලේඛන සෑදීම හොඳ මදි.මෙය සත්‍යද අසත්‍යද කියා සොයා බලන ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලීමකුත් සිදුකර තිබෙනවා.බොහෝමයක් පිරිස එම ප්‍රදේශයේ එම ආයුර්වේදයෙන් බෙහෙත් ලබාගැනීමට කැමැත්තෙන් සිටිනවා. එම නිසා ආයුර්වේද වෛද්‍යවරයා විසින් ඉල්ලන ලද බෙහෙත් තමා මෙම ආයුර්වේදයට ලබාදී ඇත්තේ.එම බෙහෙත් තිබියදීත් එම ආයුර්වේද වෛද්‍යවරයා එම ස්ථානයට නොගියහොත් ,එම බෙහෙත් කල් ඉකුත් වී විනාශ වී යනවා.එම පාඩුවත් සභාවට. එම නිසා එතුමිය නොයනවානම් ,එම බෙහෙත් වෙනත් ස්ථානයකට ලබා දෙනවාද, කුමක් සිදුකරන්නේද යන්න පිළිබඳව කළමනාකරණයක් ඇතිකරගත යුතුයි. අපි වරිපනම් වැනි ලැබෙන ආදායමින් තමයි මෙම බෙහෙත් මිලදී ගනු ලබන්නේ. මුදල් අය කිරීමකින් තොරව බෙහෙත් ලබාදෙන්නේ.සුභ සාධන කටයුතු සිදුකරනවා නම් ඒ සඳහා වියදම් කරන මුදල් අපතේ නොයන ලෙස එය සිදුකල යුතුයි.එම නිසා ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකිරීම වඩාත් සුදුසුයි කියා මම සිතනවා.

**සභාපතිතුමා:-**
ඒ සම්බන්ධයෙන් මම කමිටුක් වෙනම පත්කර පරීක්ෂණයක් සිදුකරනවා.

සභික ආර්.ඒ. නන්දසේන මැතිතුමා:-
ඔබතුමාට මම කිහිප වතාවක්ම කියා සිටියා මාහිංගොඩ ප්‍රදේශයේ එළුවන් තවම නිදැල්ලේ සිටිනවා. එයට විසඳුමක් ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා. එමෙන්ම වතුර බවුසරයෙහි මැෂිම නැතිවීම සම්බන්ධයෙනුත් කඩිනමින් පරීක්ෂණයක් සිදුකරන ලෙස සභාවට පැමිණි අලුතම ඉල්ලීමක් කළා.පෞද්ගලිකව ද මාහට ද එම මැෂින් එකට කුමක් සිදුවුණාද යන්න දැනගැනීමට කැමතියි.එමෙන්ම මීළඟට පත්වන මන්ත්‍රීතුමන්ලාට යහපත් ලෙස කටයුතු කිරීමට හැකියාව ලැබේවායි කියා පතනවා.

**සභාපතිතුමා:-**
වතුර මැෂින් එක සම්බන්ධව පරීක්ෂණයක් පළාත් සභාවට යොමුකර තිබුණා. පළාත් සභාවෙන් නැවත ප්‍රාදේශිය සභාවට යොමුකර තිබුණා කමිටුවක් පත්කර මු.රේ.104.4 යටතේ පරීක්ෂණයක් සිදුකරන ලෙස.ඒ අනුව කටයුතු කිරීමට සූදානමින් සිටිනවා. එම මාහිංගොඩ ප්‍රදේශයේ පවුල් තුනක සතුන් තමා එහි සිටින්නේ.මම එම පවුල් තුනට ගොස් කියා සිටියා එය නොකරන ලෙස. එම පවුල් තුනෙහි ලිපිනයන් මට සොයා දෙන්න ලිපි මගින් දැනුවත් කිරීම සඳහා.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**
පාසල් ළමුන් සඳහා පොත් ලබාදීමට යෝජනා සම්මත වී තිබෙනවා.ගම්වල දුප්පත් ළමුන් පොත් මිලදී ගැනීමට නොහැකිව අසරණ වී සිටින අවස්ථාවක එයින් මුදවා ගැනීමට නම් නැවත පාසල් වාරය ආරම්භ කිරීමට ප්‍රථම කඩිනමින් පොත් ලබාදෙනවා නම් හොඳයි. එය අයාලේ යාමට නොදිය යුතුයි කියා මම සිතනවා.

**සභාපතිතුමා:-**
අපි ඒ සඳහා ඉල්ලුම්පත්‍රයක් පාසල් සඳහා ලබාදී තිබෙනවා. මෙම මැතිවරණ කාලයේ එයට මැදිහත් වීමට නොහැකි වී තිබෙනවා.

**සභික ආර්.ධනරත්න මැතිතුමා:-**
මෙනේරිවත්ත පාරේ සිට සමරනායක සර් ගේ නිවසට යන පාර සෑදීම සඳහා එතුමාගේ ඉඩමෙන් හෝ එම පාර ලබාදෙයි. එතරම් යහපත් අයෙක් එතුමා. එතුමා සමඟ සාකච්ඡාකර හෝ එම මාර්ගය සකසා දෙන ලෙස ඉල්ලා සිටිනවා. හිටපු සභාපතිතුමාගේ කාලයේ සිට කිවූ දෙයක් විලේගොඩ ප්‍රදේශයේ කසළ ගැටළුවකුත් තිබෙනවා. විලේගොඩට පැමිණෙන කසළ ට්‍රැක්ටරය සතියකට දෙකකට වතාවක් හෝ යොදවා එහි කසළ රැගෙන යන ලෙස ඉල්ලා සිටිනවා.මහජනතාවගේ යහපත වෙනුවෙන් ඒ දෙයත් ඉටුකර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**සභික හරිස්චන්ද්‍ර කිරිඇල්ල මැතිතුමා:-**
මීට මාස 07 ,08කට පෙර ලංකාවේ තිබූ ආර්ථික අර්බුදය අවසන් කියා අප සිතීම වැරදියි. එය අවසන් වී නැහැ. මේ වන විට වැඩි වී තිබෙනවා. පියවරෙන් පියවර තමා යම්කිසි ස්ථාවර මට්ටමකට ගෙන ආ හැක්කේ. ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රකාශකර තිබෙනවා, මෙම වසරේ අවසන් කාර්තුව වන විට රජයේ නිලධාරීන් සඳහා යම් කිසි අතිරේක මුදලක් වැටුප වශයෙන් ලබාදීමට හැකි ලෙස රටේ ආර්ථිකය යහපත් මට්ටමකට ගෙන එනවාය කියා. එමෙන්ම රටක අභිමානය රැඳී තිබෙන්නේ එම රටේ නිදහස් දිනයේ දීයි. අවම මුදලක් වැයකර එම නිදහස සැමරීමෙන් අපේ රට පිළිබඳව වෙනත් රටවලට තිබෙන ප්‍රතිරූපය වෙනස් කිරීමට හැකියාව ලැබෙනවා. වෙනත් රටකින් අපට ණයක්,ආධාරයක්, අයෝජකයෙක් ලංකාවට පැමිණීම හෝ විදේශ සංචාරකයින් ලංකාවට පැමිණීම මෙම නිදහස් උත්සවය සමරන ආකාරයෙන් වෙනස් වෙනවා. රටේ තිබෙන අභිමානය,ස්වෛරීත්වය,නිදහස පැහැදිලිවම මෙම නිදහස් උත්සවයෙන් ඔප්නැංවෙනවා.එම නිසා තමයි යම්කිසි සුළු මුදලක් වැය කර එම උත්සවය පැවැත්වීමට ජනාධිපතිතුමා තීරණය කළේ.අද එහි ප්‍රතිඵල භුක්ති විඳිනවා. පෙබරවාරි මස මේවන විට 130,000.00කට අධික විදේශ සංචාරකයින් ප්‍රමාණයක් ලංකාවට පැමිණ

තිබෙනවා. එමනිසා ඩොලර් මිලියන 30ක්වත් නොතිබූ මේ රටෙහි විදේශ සංචිතය මේවන විට ඩොලර් බිලියන 02 ඉක්මවා ගොස් තිබෙනවා. එමනිසා ආර්ථික අර්බුදය යම්කිසි දුරකට සමනය කරමින් යන අවස්ථාවේදී මැතිවරණය පිළිබඳව ජනතාව දැනුවත් කර මැතිවරණයක් තිබීමට අවශ්‍යයි කියනවා. එමෙන්ම මෙම මැතිවරණ කොමිසමට අදාලව ඔවුන් ප්‍රකාශ නිකුත් කර මැතිවරණ දිනයක් මාර්තු 09 ලෙස නම්කර තිබෙනවා. නමුත් මෙම මැතිවරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සමක් විභාග වෙමින් පවතිනවා. එක් පෙත්සමකින් තීන්දුවක් ලබාදුන්නා මැතිවරණ කොමසාරිස්තුමාගේ සැලසුම් අනුව මැතිවරණයක් තැබීමට කිසිඳු බාධාවක් නැහැ කියා. නමුත් මැතිවරණ කොමසාරිස්තුමා පමණක් නොවෙයි මෙම මැතිවරණය පවත්වන්නේ. ඔහුට අනිකුත් රාජ්‍ය ආයතනවල සහාය අවශ්‍යයි. නීතිමයව, ව්‍යවස්ථානුකූව එම රාජ්‍ය ආයතන බැඳී සිටිනවා ඉන්ධන ,විදුලිය,පොලිස් ආරක්ෂාව,ගමනාගමන පහසුව,මුද්‍රණ කටයුතු,රාජ්‍ය සේවක වැටුප්, ලබාදී මැතිවරණයක් පැවැත්වීමට මැතිවරණ කොමිසමට සහාය ලබාදීමට. නමුත් අද රට තුළ පවතින ආර්ථික අවපාතය නිසා මෙම මුදල් ලබාදීමේ ගැටළුවක් පවතිනවා. රටේ ආර්ථිකව පසුබා තිබෙන අවස්ථාවක, ජනතාව බේරා ගැනීමට ඉදිරියට නොපැමිණි අය ආර්ථිකය යම්කිසි මට්ටමකට දියුණු වී ඇති විට මෙය තමා හොඳම අවස්ථාව කියා සිතා පටු අරමුණු වෙනුවෙන් ඡන්දයක් පැවැත්වීමට උත්සාහ දරමින් සිටිනවා. එ.ජා.පක්ෂය ලෙස අප කිසිඳු මැතිවරණයකට බියක් නැහැ. ජනතාව කැමතිනම් තේරී පත් වේවි.අකමැතිනම් පැත්තකට වී සිටිනවා. මැතිවරණය පිළිබඳව නොවෙයි අපට ගැටළුව තිබෙන්නේ.ආර්ථිකව අප අවපාතයකට මුහුණ දී සිට මේවන විට යම් කිසි ස්ථාවර මට්ටමකට පැමිණි විට නැවතත් ඡන්දයක් පවත්වා ආපසු අඳුරු යුගයකට යනවා නම් මෙම මන්ත්‍රීතුමන්ලා 8500ක් තේරී පත්වීමෙන් ඇති රටට යහපතක් සිදු නොවනවානම් එහි ඇති එල ප්‍රයෝජනය කුමක්ද කියා මම අසනවා. ආර්ථිකය ශක්තිමත් වූ පසු ඉදිරියේදී නියමිත කාලයන් වලදී මැතිවරණය පැවැත්වීමට අප සූදානම් වනවා. මැතිවරණය සෑම වසරකම නියමිත කාලවලදී තැබිය යුතුයි කියා නීතියක් නැහැ. මැතිවරණ ඉතිහාසය නොදන්න අයටයි මම මේ කියන්නේ, 1975 වසරේදී මේ රටෙහි විශාල ආර්ථික අර්බුදයක් පැවතියා. එම අවස්ථාවේදී විපක්ෂනායක ලෙස සිටියේ ජේ.ආර්.ජයවර්ධන මහතා.එතුමා සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනියට සහාය ලබාදුන්නා මැතිවරණයක් පැවැත්වීමට අවශ්‍ය නැහැ.අපි අවුරුදු 02කට මැතිවරණය කල් දාමුය කියා. පසුව 1977 දී මැතිවරණයක් පැවැත්වුවා. අගමැතිතුමියත්,විපක්ෂනායකතුමාත් එයට කැමති වුණා. එලෙසයි අතීතයේදී වැඩකටයුතු සිදු වූයේ. නොයෙකුත් අර්බුද අවස්ථාවන් වලදී එලෙස වෙනස් කරමින් නියමිත කාලයට පෙරත් මැතිවරණ පවත්වා තිබෙනවා. එසේනම් මෙම මැතිවරණය තැබීම පිළිබඳව නැවත වරක් අප අපේ හදවත් වලින් ප්‍රශ්න කල යුතුයි. අද මැතිවරණයක් පැවැත්වුවහොත් 50%කට වැඩි ඡන්දදායකයින් ප්‍රමාණයක් ඡන්දය ලබාදීමට නොපැමිණෙනවා. 30%ක් පමණයි පැහැදිලිවම තම ඡන්දය ප්‍රකාශ කරනු ලබන්නේ. ඉතිරි 20%ක ප්‍රමාණයත් ඡන්ද කොලය කටුගා දමනවා.මිනිසුන්ට අවශ්‍ය ඡන්දයක් නොවෙයි. පොළවේ පය ගසා සිටින දේශපාලකයෙක් නම් ඔවුන්ගේ නිවෙස්වලට යන්න. ඔවුන් පැහැදිලිව කියා සිටින්නේ මෙම අවස්ථාවේදී ඡන්දයක් එපාය කියා. මැතිවරණයක් ඉල්ලා මිනිසුන් උසිගන්වන්නේ මෙම පරපුටු දේශපාලන පක්ෂයි. ඔවුන් සිතා සිටින්නේ බොර දියෙහි මාළු බෑමටයි. මෙම අර්බුද අවස්ථාවේදී සමාජ මාධ්‍යජාල කයිවාරුකාරයින්ට ඡන්දය ලබාදෙයි කියා සිතන්න එපා ජනතාව ඊට වඩා බුද්ධිමත්. ජනතාව සැදී පැහැදී සිටිනවා අවශ්‍ය අවස්ථාව එනතෙක් සුදුසු පුද්ගලයෙක් පත්කිරීමට .නමුත් එයට සුදුසු අවස්ථාව මෙය නොවයි කියා මම කියා සිටිනවා. එමෙන්ම මගේ මවගේ අවමංගල්‍ය වෙනුවෙන් පැමිණි ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ගරු සභාපතිතුමා,ලේකම්තුමා,කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සියලුදෙනාටමත් පැමිණීමට නොහැකිව ශෝකය ප්‍රකාශකල සියළුදෙනාටමත්, මගේ ගෞරවය ,ප්‍රණාමය මෙම අවස්ථාවේදී මම පුදකර සිටිනවා.එතුමියගේ හත් දවසේ බණ හෙට දිනයේදී පැවැත්වෙනවා. ගරු සභාපතිතුමාටත්,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මණ්ඩලයේ සියලුදෙනාටමත් ,පුවත්පත් කලාවේදී මහතුන් දෙදෙනාටමත් මම ගෞරවයෙන් ආරාධනාකර සිටිනවා එම අවස්ථාවට පැමිණ සහභාගී වන ලෙසට.

**සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-**

ගරු මන්ත්‍රී හරිස් කිරිඇල්ල මැතිතුමාගේ මෑණියන් වන එච්.ඒ.කරුණාවතී මැතිනියට නිවන්සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරනවා.එතුමියගේ අභාවය වෙනුවෙන් එතුමියගේ පවුලේ සියළුදෙනාටම ශෝකය ප්‍රකාශකර සිටිනවා. එතුමාගේ කතාවේ නොතේරෙන ස්ථාන තිබුණා. පළමු කරුණ, නිදහස් දිනය අඩු වියදමින් සිදුකරනවාලු,එයට මුදල් තිබෙනවා. අත්‍යවශ්‍ය නොවන සැත්කම් නොකරන්නලු.එම අත්‍යවශ්‍ය නොවන සැත්කම් මොනවාද කියා දැනගැනීමට කැමතියි. මේවා තමා මහජනතාවට ඇති ගැටළු. අප වෛද්‍යතුමන්ලාට මුදල් ලබාදෙන්නේ අත්‍යවශ්‍ය සැත්කම් පමණක් සිදුකිරීමටද? පීඩිත අහිංසක ජනතාවගේ සැත්කම් සිදුකිරීමට මුදල් ලබානොදෙන මෙම ආණ්ඩුව නිදහස් දිනයේදී තාවකාලික වැසිකිළි සඳහා එතරම් මුදල් ප්‍රමාණයක් වියදම් කරනවා. පසුව කියනවා මැතිවරණයට මුදල් නැති බව. අත්‍යවශ්‍ය ඖෂධ ගෙන ඒමට බැරි ආණ්ඩුව,මැතිවරණයට බිලියන 0.7ක වගේ සුළු මුදලක් වැය කිරීමට නොහැකි ආණ්ඩුවක් කෙලෙසකද රටක් පාලනය කරන්නේ. ජනතාවට වගකියන ආණ්ඩුවක්ද මෙය. ජනතාව අපව විශ්වාස කර ඡන්දය ලබා දුන්නා .දැන් ඔවුන් නොසලකා හැර අලි, පොහොට්ටු පූට්ටු ආණ්ඩුවක් තමා ගෙන යන්නේ.

**සභාපතිතුමා:-**

මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙනුවෙන් කීවත් නොකීවත් මිනිසුන් ඡන්දය ලබා දෙනවා.
මැතිවරණයක් නොතියන බව අප කියා නැහැ. මෙම ආර්ථික අර්බුදය මුළු ලෝකයේම තිබෙනවා.

-සභාව තුළ ඝෝෂාව-

**සභික දිලීන් සමුදිත කරුණාපාල මැතිතුමා:-**

එතුමා කියා සිටියා සංචිත බිලියන ගණනකින් වැඩිකර තිබෙනවා කියා.සංචිත වැඩිකර ගත්තේ හරියට ආහාර වේලක් කන්න නැති ජනතාවගේ බත් පතට බදු ගසා ,අහිංසක මිනිසුන්ගේ බදු මුදලින්. අසාධාරණ බදු ප්‍රතිපත්තියක් ගෙන ආවා. එදාවේල කන්න නැති ජනතාවගේ අවසන් ලේ ටිකත් උරාබොන වැඩපිළිවෙලක් ගෙන යන්නේ. එමෙන්ම 1977 කාලයේ ජන මතය නොවෙයි දැන් තිබෙන්නේ. විකෘති ජන මතයක් තමයි දැන් තිබෙන්නේ. එම නිසා අපි පක්ෂයක් ලෙස,මන්ත්‍රීවරු ලෙස ,ජනතාව ලෙස තීන්දුවක් ගනු ලැබුවා මෙම

ආණ්ඩුවට තවදුරටත් සහාය ලබා නොදෙන බවට.අපිට පොරොන්දු වූ ප්‍රතිපත්ති ප්‍රකාශනය නොවෙයි මේවන විට ක්‍රියාත්මක වන්නේ. 69 ලක්ෂයේ ජනතාවට එක්වීමට කඳවුරක් අවශ්‍ය නිසා ප්‍රගතිශීලී ජනතාව වන අපි සන්ධානයක් ලෙස එක්ව නිදහස් ජනතා සන්ධානයෙන් මෙවර මැතිවරණයට ඉදිරිපත්වන බවත් මෙහිදී කියා සිටිනවා.අප කියා සිටින්නේ නියමිත කාලයේදී පළාත් පාලන ආයතන විසුරුවා ගමේ ජනතාවට වැඩකරන්න පුළුවන් නායකයෙක් පත්කිරීමට හැකි ලෙස මැතිවරණයක් පවත්වන ලෙස.

**සභික අශෝක ගුණරත්න මැතිතුමා:-**

මෙම කතාවෙන් මට සිතෙනවා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඔයින් බේරුනා මදැයි කියා. අසංක නවරත්න මහත්තයට ඇමතිකමක් දුන්නා නම් රනිල් වික්‍රමසිංහ මැතිතුමා මහා ප්‍රගතිශීලී නායකයෙක් වෙනවා.මහින්ද මහත්තයා ඔය තරම් නරක නම් පොහොට්ටුවෙන් ඉල්ලා අස් වෙන්නකෝ.

-සභාව තුළ ඝෝෂාව-

**සභික අශෝක ගුණරත්න මැතිතුමා:-**

10%කට බදු පනවා 90%කගේ යහපත වෙනුවෙන් ක්‍රියා කරන විට එයත් නරකයිලු. බදු තිබ්බත් නැතත් නරකයිලු.

-සභාව තුළ ඝෝෂාව-

**සභික අශෝක ගුණරත්න මැතිතුමා:-**

අපේ රට තිබෙන්නේ අමාරු ආර්ථික අවස්ථාවක.එය අප සැවොම පිළිගත යුතුයි. අපිට තිබෙන්නේ මිශ්‍රවාදී ආර්ථික ප්‍රතිපත්තියක්.එහි අභියෝගය භාරගත් රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අප ස්තුතිවන්ත විය යුතුයි. මොවුන්ට අවශ්‍ය නැවත රට අරාජික කිරීමටයි. මැතිවරණ කොමිෂම මැතිවරණයක් ප්‍රකාශයට පත්කර තිබෙනවා. ඒ අනුව අපි සැම පක්ෂයක්ම අපේ කටයුතු සිදුකරගෙන යමින් තිබෙනවා. නමුත් අපගේ අදහසක් තිබෙනවා මෙම අවස්ථාවේදී මැතිවරණයක් අනවශ්‍ය බවට. අද රට තුළ ගැටළුවක් තිබෙනවා. අපි එය පිළිගත යුතුයි. මෙම දැවෙන ප්‍රශ්න විසඳිය යුතුයි. අපි අභියෝග වලට ආසයි.ආදරෙයි. එම නිසා අභියෝග ජයග්‍රහණය කර මෙම සභාව නැවත පිහිටුවනු ලබන්නේ පොහොට්ටුවෙන් බව මම කියා සිටිනවා.

**සභික ශිරාන් සමරතුංග මැතිතුමා:-**

රත්නපුර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් කියා තිබුණා ,පොහොට්ටුවෙන් අයින් වූ මන්ත්‍රීවරුන්ට අයින් වන ලෙස දන්වා ලිපියක් යවන ලෙස පොහොට්ටුවේ ලේකම්ට.එම ඇමතිට කියන්නේ අපි විතරද අයින් වුණේ. එයා පරිවාස කාලේ මාස 03ක් එළියේ ඉඳලා අපි හදලා තිබූ ගෙට ඇවිල්ලා, පොහොට්ටුවට රිංගලා අද මෙලෙස කියනවා. පොහොට්ටුව යනු තනි පක්ෂක් නොවෙයි. මහින්ද මහත්තයගෙ පෞද්ගලික බූදලයක් නොවෙයි.එයට උත්තර හම්බ වෙයි. අපි එ.ජා.පක්ෂයේ මැරයන්ට විරුද්ධව සටන් කරන විට කවුරුවත් සිටියේ නැහැ.

-සභාව තුළ ඝෝෂාව-

**සභික ශිරාන් සමරතුංග මැතිතුමා:-**

හැත්තෑ ගණන්වල එ.ජා.පක්ෂයේ දේශපාලනයෙන් අපි තරම් බැට කාපු අය නැතුව ඇති. මෙහි සිට කැගල්ලට පත්වීම මාරුකළ මගේ අම්මා කිරි බොන දරුවත් රැගෙන බස් රථයේ තනි අතින් එල්ලී ගියේ.මේ තරම් දුෂ්ඨ විදිහට මිනිස්සුන්ට වැඩකල එක්සත් ජාතික පක්ෂය සමඟ දීග කන්න පොහොට්ටුවට පුළුවන් උනාට අපිට බැහැ. හැත්තෑවේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව කාලයේ ආයතන 21ක් හැදුවා. අදවන විට එම ආයතන ටික රැකගන්න බැරවුණා මේ අයට. ප්‍රේමදාස මහතා ඇඟලුම් කර්මාන්ත හැදුවලු. නමුත් මේ රටේ රෙදි නිෂ්පාදනය කල එක ගැන කතා කරන්නේ නැහැ. එම කම්හල් වසා දැමුවා. රෙදි ගෙනත් මහල අඳින එක ගැනයි කතා කරන්නේ.මිනිසුන් අන්ධ වෙලා තිබෙන්නේ. නිෂ්පාදන ආර්ථිකයක් මේ රටේ තිබුණා. අඩුම තරමේ මේ සභාවට සභාපති කෙනෙත් පත්කර ගැනීමට නොහැකි ලේකම් කෙනෙක් සිටින පක්ෂයෙන් ඇති ඵලය කුමක්ද?

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**

යළි නැවත මෙම සභාවේ සිටිය හැක්කේ දෙතුන් දෙනාටයි. එයයි ඇත්ත කථාව. තරහා වෙන්න එපා. මෙය අපගේ අවසන් කතාවද විය හැකියි. එමෙන්ම මෙම මහින්ද මහත්තයා කියනා චරිතය අඩුපාඩුකම් තිබුණත් දුටුගැමුණු රජතුමාගෙන් පසු බිහි වූ ඓතිහාසික චරිතයක්. එම නිසා අප කවුරුත් දන්නවා පොහොට්ටුව පැත්තකින් තබා කථා කළොත් 2018 වසරේ සිට මෙම සභාවේ සිටින මහජන නියෝජිතවරුන් සහ නියෝජිතවරියන් මහින්ද මහත්තයට පිංසිදු වීමටයි පැමිණියේ.එය පිළිගන්න.හෘද සාක්ෂියත් සමඟ එකඟ වන්න. අප සැවොම මේවන විට ජනතාවට භාර වී සිටිනවා. අපි ජනතාවට මුහුණ දිය යුතුයි. දිනීමට හෝ පැරදීමට අපි මෙයට මුහුණ දිය යුතුයි. ජනතාව තීන්දු කරාවි කවුරුන්ද සුදුසු කියා. මෙහිදී ජාතික ප්‍රශ්න කතා කර තේරුමක් නැහැ. එම නිසා අපි එක්ව ගමට ගොස් වැඩ කරමු. වසර 04ක් , තිලක් සභාපතිතුමාත් මම සිහිපත්කරනවා.එතුමාගේ අසනීප තත්වයත් සමඟ ලබාදීමට හැකි සහය ලබා දුන්නා , රුවන් ලියනගේ මැතිතුමා,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය සියළුදෙනාට මගේ හද පිරි ප්‍රණාමය පුදකර සිටිනවා.මම දන්නේ නැහැ මට මීළඟ සභාවට පැමිණීමට හැකිවේවිද කියා. හෙට වන විට මම පරදින්නත් පුළුවන්. එදා අරගලයට ගොස් අතුකෝරල මන්ත්‍රීතුමා මරණයට පත්වුණේ නිරපරාදේ. මරන්න ඕනි මාව. මම තමයි එම දැඩි නිර්භීත ප්‍රකාශ සිදුකර පැමිණියේ,අපේ පක්ෂය වෙනුවෙන්,අපේ ආසනය වෙනුවෙන්. නමුත් හෘද සාක්ෂියට එකඟව වැඩකළ නිසා සමන් දෙවිඳුන්ගේ පිහිටෙන් කරදරයක් සිදු වූයේ නැහැ.මෙයයි ඇත්ත. එම නිසා අප තේරුම්ගත යුතුයි,අපගේ භූමිකාව. 1987 අංක 15 දරන පනතේ තිබෙන්නේ, ගමේ කාණුව,ගමේ බෝක්කුව වැනි පොඩි පොඩි කාරණා ගැන. එබැවින් ලොකු ලොකු දේ පිළිබඳ කථාකර හැන්සාඩ් ගතවීමට කාරණා නැහැ. ලොකුවට කෑගැහුවට වැඩක් නැහැ. අපේ ගමට,අපේ කොට්ඨාශයට මුහුණ දීමට නොහැකි නම්.

එතනින්ම අපේ මට්ටම තේරුම්ගත යුතුයි. මෙයයි ඇත්ත.මෙයට මුහුණ දෙන්න. මෙතන කවුරුවත් වැඩ නොකරපු අය නැහැ. අපි යමක් කළා. කරන්න උත්සාහ කළා. එම නිසා මගේ යකුදාගොඩ කොට්ඨාශයට නම් ගරු සභාපතිතුමා,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හැකි අයුරින් සිදුකල උදව් උපකාර සඳහා ගමේ ජනතාව වෙනුවෙන් අපේ ගෞරවය ප්‍රණාමය පුදකර සිටිනවා. ජනතාව තීන්දු කලහොත් සුජීව අපට සුදුසු නැහැ කියා, අප එයට හිස නමා අපේ පවිත්‍රා වන්නිආරච්චි ඇමතිතුමියත් සමඟ මහින්ද රාජපක්ෂ මැතිතුමාත් සමඟ ,ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පොහොට්ටුවත් සමඟ සිටිනවා. බොහෝ අඩුපාඩුකම් තිබෙනවා.අපි ස්වයං විවේචනය කරනවා.නමුත් මහින්ද රාජපක්ෂ කියන එම නිර්භීත ඓතිහාසික නායකයාට අගෞරව කළොත් අපේ දරුවෙකුගෙන් හරි ඒ දෙය යනවා. සියලු දෙනාටම සමන් දෙවි පිහිටයි.

**සභාපතිතුමා:-**

විවිධ අදහස් ඉදිරිපත් කළා. අපි කවුරුත් දන්නවා අතිගරු ජනාධිපතිතුමා මෙම ජනාධිපතිධුරය භාරගැනීමට පෙර ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ආරාධනය කළා තවත් කීප දෙනෙකුට.නමුත් ඔවුන් ආසයි බයයි මට්ටමට සිටියා. අද බොරුවට කෑ ගසනවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් මෙම මැතිවරණයට ඉදිරිපත් වූ මන්ත්‍රීතුමන්ලා මෙම සභාව නියෝජනය කරනවා. විවිධ සභාවල සිටිනවා. ඒ අයට යාමට අවශ්‍ය නම් එම පක්ෂයෙන්ම යා යුතුයි. අයින් කරනතුරු සිටිය යුතු නැහැ. ගෞරවාන්විතව යා යුතුයි. ප්‍රාදේශිය සභා පනතේම තිබෙනවා මන්ත්‍රීධුරය අහෝසිවන හේතු. ඒවා අපට වැළැක්විය නොහැකියි. මෙහි කෑ ගසා තේරුමක් නැහැ. ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිනියට විවේචනාත්මකව අදහස් ඉදිරිපත් කළා.මේ පිළිබඳව බොහෝම කනගාටු වෙනවා. එතුමිය නිර්භීත නායිකාවක්. එතුමිය ඉතාම නිර්දෝෂී නායිකාවක්. එතුමිය මෙම රටට සිදුකල හැකි උපරිම කැපවීමෙන් සේවය කළ නායිකාවක්. පාර්ලිමේන්තුවේ දූෂණයෙන් තොරව සිටින අතලොස්සෙන් පළමු ප්‍රධානම චරිතය එතුමිය. තම පෞද්ගලික මුදලින් වියදම්කර සිදුක යුතු සෑම දෙයක්ම සිදුකරනවා. එතුමියට තිබෙන ආදායම් හොඳටම ඇති කාගේවත් මුදල් අවශ්‍ය නැහැ.එතුමියගේ පියාගේ දේපල වලින් එතුමිය දේශපාලනය සිදුකරනු ලබන්නේ. එම නිසා අගෞරවාත්මකව කථා කිරීම සම්බන්ධව මම මෙම සභාවේ මගේ දැඩි විරෝධය සහ කනගාටුව ප්‍රකාශ කර සිටිනවා.එමෙන්ම විවිධ අවස්ථාවන් වල අවුරා ලංකා වැනි විවිධ දේ ගෙනහැර දක්වමින් නොකිය යුතු දේ කියනවා. එමෙන්ම මෙම පොහොට්ටුව ලකුණට ,ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට පිංසිඳු වීමට මෙම ප්‍රාදේශිය සභාව නියෝජනය කරන අද බොරුවට දොඩවනවා. පොදුජන පෙරමුණට විරුද්ධව. පොදුජන පෙරමුණෙන් ඉවත් වී වෙනත් ලකුණකින් තරඟ කරන කිසිඳු අපේක්ෂකයෙකුට ජයග්‍රහණය කර මෙම ප්‍රාදේශිය සභාව නියෝජනය කිරීමට ලැබෙන්නේ නැහැ. පාර්ලිමේන්තුවට යාමට සිදුවන්නේත් එල්ලීගෙන.එමෙන්ම අපේ හිටපු පළාත් සභා මන්ත්‍රී සිරිපාල කිරිඇල්ල මැතිතුමාගේ ආදරණීය බිරිඳ සහ අපේ විපක්ෂ නායක හරිස් කිරිඇල්ල මැතිතුමාගේ ආදරණීය මෑණියන්ගේ අභාවය පිළිබඳ අපගේ කනගාටුව ප්‍රකාශ කර සිටිමින් අද දින මෙම සභාව නියෝජනය කිරීමට පැමිණි ගරු මන්ත්‍රීතුමන්ලාටත්, ලේකම්තුමා ප්‍රධාන වාර්තා කරන නිලධාරී දෙපළටත් ස්තුතිවන්ත වෙමින්. අදට නියමිත සභා රැස්වීම මින් නිමා කරනවා. දැන් වේලාව ප.ව.01.22 යි.

රුවන් ලියනගේ,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.